2026.07.14 වන දින සාමාන්‍ය රැස්වීම් වාර්තාව.
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ජූලි මස 14 වන දින පෙ.ව 9.30 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාවයි.

සහභාගීත්වය:-

01.ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

02. ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා

03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. එච්. එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා

05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා

06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා

07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා

08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය

09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය

10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී. ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා

11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ. සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා

12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා

13.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා

14.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා

15.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය

16.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා

17.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා

18.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා

19.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එල්. ජයසේකර මැතිතුමා

20.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී. සුමිත් ප්‍රියංකර මැතිතුමා

21.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා

22.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා

23.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා

24.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය

25.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා

26.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා

27.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

28.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී පී. ඒ. කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය

29.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා

30.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. රංජිත් වික්‍රමසිංහ මැතිතුමා

31.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. පී.ජේ.පී.හිරිපිටිය මැතිතුම

32. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

33.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්. ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා

34.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය

නොපැමිණීම්

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා

02. .ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය

කාර්ය මණ්ඩලය

01. ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා	- ලේකම්
02. ජී.අයි.කේ.ජයතුංග මිය	- සංවර්ධන නිලධාරී
03. සී.චන්දිමා ප්‍රියදර්ශනී මිය	- සෞඛ්‍ය කම්කරු

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පැමිණ සිටි උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීරුන්, මන්ත්‍රීවරියන්, මාධ්‍යවේදීන්, සභා ලේකම්තුමා හා කාර්යාලයේ නිලධාරීන් දෙපළ පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

(අ) 2026.06.09 වන දින පැවති සාමාන්‍ය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා**.**

2026.06.09 වන දින පැවති මහා සභා රැස්වීමේදී ආගම සිහි කිරීමෙන් අනතුරුව 17 වෙනි විරු සැමරුම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් පැවැත්වීමට තමන් විසින් යෝජනා කළ බවත් එය සභාවේ ප්‍රතික්ෂේප වුණ බවත්, නමුත් ඒ සම්බන්ධව සභා වාර්තාවේ වාර්තාගත වී නොමැති බවත්, එය වාර්තාවේ ඇතුළත් කරන ලෙසත් මින් ඉදිරියට එවැනි අඩුපාඩු නොමැතිව සභාවේ කරන කියන සෑම දෙයක්ම වාර්තාගත විය යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**.**

පිටු අංක 31හි තමන් විසින් ඇඹිලිපිටිය කියා පැවසූ දෙය හිරිපිටිය ලෙස සඳහන්ව ඇති බැවින් එය නිවැරදි විය යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

පිටු අංක 36 හි 2015 සිට 2025 දක්වා නඩු කටයුත්තක් පැවති බව තමන් විසින් සඳහන් කළ කාරණය බවත්, 2025 සිට නඩු කටයුතක් සඳහා පැවරීමක් සිදු වන බව වශයෙන් වාර්තාවේ සඳහන්ව ඇති බැවින්, එය 2015 දෙවෙනි මස සිට 2025 දක්වා නඩු කටයුත්ත පැවති බව යනුවෙන් නිවරදි විය යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙතෙක් කලක් සභා වාර්තාව වාචික භාෂාවෙන් සකස් කළ ද පසුගිය වාර්තා හා මෙම වාර්තාව සංසන්දනය කළ විට තේරුම් ගැනීමේ අපහසුතාවයක් පවතින බැවින් අවසානයේ සාරාංශය ගත් විට බවත්, බවත් ලෙස සඳහන් වන බැවින් තේරුම් ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. පෙර සභා රැස්වීම්වලදී මෙන් වාචිකව ඉදිරිපත් කළ කරුණු ඒ ආකාරයෙන්ම වාර්තාවේ ලියවිය හැකි නම් එය උචිත බවත්, සභිකයෙක් ලෙස තමන් කැමති පෙර පැවති ආකාරයට වර්තා සකස් කරනවාට බවත්, මෙතෙක්

වාචිකව වාර්තාගත වූ වාර්තාව මේවන විට ලිඛිත භාෂාවෙන් වාර්තාගත වීම යම් කිසි උපදෙසක් හෝ නීත්‍යානුකූල පසුබිමක් මත නිර්මාණය වූවාද කියා ගරු සභාපතිතුමාගෙන් දැන ගැනීමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

එලෙස කිසිවක් නොමැති බවත්, තමන් කියන තේමාව එක නම් කියන අදහස සඳහන් වනවා නම් පෙර පැවති ආකාරය වුවත් සුදුසු බවත්, අන්තර්ගතය නිවැරදි වීම විය යුතු බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙය තමන්ගේ පෞද්ගලික අදහසක් ලෙස ප්‍රකාශ කරන බවත් අනෙක් සභිකයින්ගෙන් තමන් විමසීමක් සිදු නොකළ බවත්. වර්තාව පෙර පරිදි සකස් කළ නොහැකි නම් 2025 වර්ෂයේ සිට වෙබ් අඩවියේ වාර්තා සියල්ල ඇතුළත් කරන බැවින් සභාවේ කතා කරන වොයිස් රෙකෝඩින එකද එම වෙබ් අඩවියේ උඩුගත කරන මෙන් ඉල්ලා සිටි අතර සමහර වේලාවල් වලදී තමන් පැවසූ දෙය සභිකයින් හට අමතක වන බැවින් එවිට වාර්තාවේ යම් කිසි ගැටළුවක් පවතිනවා නම් එය නිවැරදි ද කියා එමගින් හෝ නැවත පරීක්ෂා කර බැලිය හැකි බවත් වැඩිදුරටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් 2026.06.09 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

2026.06.09 වන දින පැවති සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව ගරු උපසභාපති යූ. එල්. එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.06.09 වන දින පවත්වන ලද සාමාන්‍ය සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.

අධිකරණ හා ජාතික ඒකාබද්ධ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/REF/JP/01/2021/VOLII හා 2026.06.24 දිනැති පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව වෙත යොමු කළ සාම විනිසුරු පදවිය සඳහා දිවුරුම් දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

1987 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනතේ පස්වන උප ලේඛනයේ සඳහන් පරිදි ප්‍රාදේශිය සභාවල සභාපතිවරුන්, උපසභාපතිවරුන් සහ සෙසු සභිකයෝ තම බල ප්‍රදේශ සඳහා නිල බලයෙන් සමාදාන විනිශ්චයකාරවරු ලෙස පත්වන බැවින් අධිකරණය ඉදිරියේ දිවුරුම් දීම අවශ්‍ය නොවන බව සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සඳහා අධිකරණය ඉදිරියේ සාම විනිසුරු දීමට සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් තමන් විසින් ඉල්ලා සිටි බැවින් එයට පිළිතුරක් ලෙස මෙම ලිපිය ලැබුණු බවත්, මෙම ලිපියට අනුව එසේ අධිකරණය ඉදිරියේ දිවුරුම් දීම අවශ්‍ය නොවන බව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා වෙත ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එම නිසා සීල් නොමැති ගරු මන්ත්‍රීතුමන්ලා විසින් එම සීල් සකස් කර ගන්නා ලෙසද ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

(ඇ) සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජත් බණ්ඩාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැනිය 2026-07.14 වන දින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපි යොමුකර තිබෙන බවත්, එම ලිපි මේ මොහොතේ සභාගත කරන බවත්, ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

2026-07.14 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජත් බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිනිය සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

2026.07.14 වන දින සාමාන්‍ය සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලා ඇති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජත් බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිනිය වෙත නිවාඩු අනුමත කිරීමේ යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.රංජත් බණ්ඩාර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිනිය ගේ නිවාඩු ඉල්ලීම සඳහා අනුමතිය ලබා දෙන ලදී.

(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

01.(i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

සභාව පත් වී වසරක කාලය තුළ ඇහැලියගොඩ බල ප්‍රදේශයේ වැඩ නිම කළ මාර්ගවල දිග කිලෝමීටර් කීයද? බල ප්‍රදේශය තුළ හදුනාගත් ඉතිරි මාර්ගවල දිග කිලෝමීටර් කීයද?

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා.

වසරක කාලය තුළ ඇහැලියගොඩ බල ප්‍රදේශයේ වැඩ නිම කළ මාර්ගවල දිග කිලෝ මීටර් 6.35 යි.බල ප්‍රදේශය තුළ හදුනාගත් ඉතිරි අත්‍යවශ්‍ය මාර්ගවල දිග කිලෝ මීටර් 149 යි යනුවෙන් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් පිළිතුරු සපයන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

පළමු සභා වාරයේදීම වැඩ බලන සභාපති වන උප සභාපතිතුමා මෙම වසර 04 අවසන් වන විට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ තිබෙන සියලු ම පාරවල් කොන්ක්‍රීට් කර අවසන් කරන බව පැවසූ බවත් නමුත් වසරක් තුළ සිදු කර ඇත්තේ 6.35 බවත්, තව වසර 03ක් ඇති බවත් ඒ වසර තුන ඇතුළත කිලෝ මීටර් 149 ක් සිදු කළ යුතු බවත්, ඒ අනුව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් පැවසූ බොරුව තහවුරු කර ගැනීමට අවශ්‍යව තිබූ බවත්, එය තමාට තහවුරු වූ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

01 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා**.**

සිරිසමන්පුර හිදුරාමගේ හේන්යායට පිවිසෙන මාර්ගයේ මීටර් 500 ක් බැකෝ යන්ත්‍රයක් යොදවා මුලික අදියර සකස් කර දීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

01 (ii) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා.

දම්මුල්ල පොළ භූමියේ බහුකාර්ය ගොඩනැගිල්ලට cctv කැමරා පද්ධතියක් සවි කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (i) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ සතිපොළ අසල v හැඩ අංක 03 කඩකාමරය බදුකරු විසින් සභාවට පවරා දීම මත එම කඩකාමරය ලංසු කැඳවා නැවත ටෙන්ඩර් කිරීමට අය කළ යුතු කීමනී (පෙර ගෙවුම්) මුදල පිළිබඳ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විමසන ලදී.ඒ අනුව RT/RP/1197 හා 2026.06.18 දිනැති ලිපියෙන් පහත තක්සේරු වාර්තාව ලැබී ඇත.

කඩ කාමර අංකය	මාසික වෙළඳපළ කුලිය	අය කළ යුතු අක් මුදල	අක් මුදල් අය කළ පසු මාසික වෙළඳපළ කුලිය
03	රු.2,000.00	රු.192,000.00	රු.1,000.00

එම තක්සේරු වාර්තාව පිළිගැනීමටත්, මෙම අංක 03 කඩකාමරය ඉහත පෙර ගෙවුම් මුදල අවම ලංසුව ලෙස සලකා විධිමත් පරිදි ලංසු කැඳවීමට සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා**.**

v හැඩ අංක 03 කඩකාමරයට අමතරව තවත් කඩ කාමර තිබේද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එම කඩ කාමර හිමිකරු මරණයට පත් වූ බවත්, පසුව එය ඔහුගේ බිරිඳ විසින් පවත්වාගෙන ගිය බවත්, ඇයට ව්‍යාපාරය කර ගෙන යාමේ අපහසුවක් හේතුවෙන් නැවත එම කඩ කාමරය සභාවට භාර දුන් බවත්, දැනට තිබෙන්නේ මෙම කඩ කාමරය පමණක් බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (ii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

RT/RP/1197 හා 2026.06.18 දිනැති තක්සේරු වාර්තාව මඟින් සතිපොළ අසල V හැඩ අංක 07 කාමරය සඳහා මාසික කඩ කුලිය 1,700.00 ක් ලෙස තක්සේරු කර ඇත. ඒ අනුව 2026 අගෝස්තු මස සිට රු.1,700.00 ක මාසික කුලියක් අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

අංක 03 කඩකාමරය සඳහා කඩ කුලිය රු.2,000.00 ක් ලෙසත් අංක 07 කඩ කාමරය සඳහා කඩ කුළිය රු.1,700.00 ක් ලෙසත් සඳහන්ව ඇති බැවින් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

අංක 03 කඩ කාමරය සඳහා කීමනි මුදලක් ලබා ගෙන තක්සේරු කර ලංසු කැඳවීමට ඉදිරිපත් කර ඇති බවත්, අංක 07 කඩ කාමරය දැනට පවත්වාගෙන යන අතර, එහි මුදල පමණක් සංශෝධනයක් සිදු කර ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (iii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ජීව වෛද්‍ය ඉන්ජිනේරු ඒකකය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබා දෙන ලෙස නිර්දේශ නොකළ ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල තුළ පවතින සෞඛ්‍ය උපකරණ හා පළමුවර වෙන්දේසි නොවූ සෞඛ්‍ය උපකරණ ප්‍රාදේශිය සභාවේ 2024 භාණ්ඩ සමීක්ෂණ තක්සේරු මණ්ඩලයෙන් තක්සේරු කර නැවත වෙන්දේසි කිරීම සුදුසු බවට යෝජනා කරමි.

1.ගරු ප්‍රාදේශිය සභා සභාපති බන්දුලසේනදුණුවිල මැතිතුමා.
2.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්. මුන්සීර් මැතිතුමා.
3.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.
4.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.
5.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී. නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය

} 2026.04.07 දින සාමාන්‍ය රැස්වීමේ තීරණ අංක ඊ 01(x) යෝජනාවට අදාළ වන සංශෝධිත යෝජනාවට අත්සන් කළ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (iv) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ වෙළඳ සංකීරණ බිම් මහල හා පළමු මහලේ අතුරුබදු නියමානුකූල කිරීමේ දී අය කළ යුතු පෙර ගෙවුම් මුදල් සම්බන්ධව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් යොමු කරන ලද RT/RP/1316 හා 2026.06.22 දිනැති වාර්තාව පහත පරිදි වේ.එම තක්සේරු වාර්තාව පිළිගැනීමටත්, ඒ අනුව පෙර ගෙවුම් මුදල්, කඩ කාමර කුලී අය කිරීමටත් සුදුසු බව යෝජනා කරමි.

කඩ කාමර අංකය		මාසික කුලිය (අක් මුදල් ගෙවීමට පෙර)	එකවර ගෙවිය යුතු අක් මුදල	මාසික කුලිය (අක් මුදල් ගෙවිමට පසු)
පළමු මහල	05	රු.6,000.00	රු.553,500.00	රු.3,000.00
	07	රු. 6,000.00	රු. 553,500.00	රු. 3,000.00
	09	රු. 6,000.00	රු. 553,500.00	රු. 3,000.00
	10	රු. 6,000.00	රු. 553,500.00	රු. 3,000.00
	14	රු. 6,000.00	රු. 553,500.00	රු. 3,000.00
	15	රු. 6,000.00	රු. 553,500.00	රු. 3,000.00
බිම් මහල	07	රු. 7,000.00	රු. 645,500.00	රු. 3,500.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (v) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පාසල් සේවා බස්රථ නවතා තැබීම සඳහා සුදුසු ස්ථානයක් ලෙස ඇහැලියගොඩ පොළ භූමිය ලබා ගැනීමට ඇහැලියගොඩ නැණ සෙත පාසල් රියදුරු සුභ සාධක සේවා සංගමය විසින් 2026/05/20 දින ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත.එම ලිපියට අනුව ප්‍රාදේශිය ලේකම් විසින් සභාව වෙත කළ ඉල්ලීමට අනුව මෙම ඉල්ලීම 2026/06/08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත යොමු කළ අතර එහිදී මෙය මහ සභාවට යොමු කර තීරණයක් ගත යුතු බවට තීරණය කරන ලදී.ඉහත ඉල්ලීම අනුව පාසල් බස් රථ නවතා තැබීම සඳහා පොළ භූමිය ලබාදීම සුදුසු බව යොජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව සාකච්ඡා කරීම සඳහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස යෝඩනා කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 10.16 ට සභා ගර්භයෙන් පිට විය.

යෝජනාවට අදාළව කරුණු මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

කාරක සභාවේ දී තිරණ හා අදහස් අනුව පාසල් සේවා බස්රථ නවතා තැබීම සඳහා පොළ භූමිය ලබාදී වෑන් රථයකින් හා බස් රථයකින් ආරම්භයක් ලෙස දිනකට රු.50.00 ක මුදලක් අය කිරීමටත් වසර අවසානයේදී විධිමත් ගාස්තු සංශෝධනයක් සිදු කිරීමටත් තීරණය කිරීම සුදුසු බව ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

පොළට ඇතුළු වන වාහන සඳහා මුදලක් අය කිරීමට පටන් ගතහොත් වාහන පොලේ ගාල් නොකරන්නට පුළුවන් බවත්, එම නිසා පොළට පමණක් සීමා නොවී නිශ්චිත දුර ප්‍රමාණයක් සඳහන් කර, එම සීමාවේ තිබෙන සෑම බස් රථයකින්ම එම මුදල අයකර ගැනීම සුදුසු බව තමන්ගේ මතය බවත්, විලේගොඩ හා මෝරගල පාරවල්වලට ගොස් බැලුවිට විශාල බස් රථ නවතා ඇති බවත්, එවිට එම මුදල් ද අයකර ගැනීම මගින් සභාවටද ආදායමක් ලැබෙන බවත් ඒ අනුව සීමාවන් නිර්ණය කරගත යුතු බව තමන් විසින් යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන බවද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

මෙම වැඩසටහන සැලසුම් සහගතව සිදුවිය යුතු පුළුල් වැඩසටහනක් විය යුතු බවත් බස් සියල්ල එකවර පාසල අසලට යාමේදී පෙර තිබූ ලෙසම තදබදයක් ඇති විය හැකි බවින්, ගරු මන්ත්‍රීතුමන්ලා පැවසූ පරිදි ඇහැලියගොඩ සෑම ස්ථානයකම මෙම වාහන නවතා ඇති නිසා වාහන හිමියන් හා පොලිසිය ද දැනුවත් කර ක්‍රමවේදයක් සකසා, ඊතල මගින් වාහන නවතා තබන ස්ථාන පෙන්වා දී මිනිසුන් ද දැනුවත් වන ලෙස ප්‍රචාරණයක් සිදු කළ යුතු බවත්, එම භූමිය පිළිබඳව ද සැලැස්මක් තිබිය යුතු බවත්, එය වාහන නැවැත්වීමට සුදුසු ස්ථානයක් විය යුතු බවත් වැඩිදුරටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ පිළිබඳව සාකච්ඡා කර අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගන්නා ලෙසත්, එවිට නිශ්චිත ප්‍රදේශයක් පිළිබඳව තීරණයක් ගත හැකි බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

නගරයේ කිලෝ මීටර් එකක් හෝ දෙකක් ඇතුළත පාසල් බස්රථ නැවැත්වීමට නොහැකි බවටත් සභාව විසින් නම් කරන ලද නිශ්චිත ස්ථානයක නැවැත්විය යුතු බවටත් මහ සභාවේ තීරණයක් ගත් විට එම සභා තීරණය ක්‍රියාත්මක කිරීම ගැටලුවක් නොවන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා පොළ භූමිය ද සුදුසු ස්ථානයක් නොවන බවත් එය කිලෝ මීටර් දෙක තුනක් හෝ පහක් ඇතුළත දුරක ස්ථානයකට ගෙන යා යුතු බවත්, නමුත් දැනට තිබෙන පහසුකම් සමඟ නගරයේ පවතින ගැටළුව විසඳීමට එම කාර්යය ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

නිශ්චිතව මෙම කාර්යය සිදුකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

සභාව මගින් තීරණයක් ගන්නවා නම් එය ක්‍රියාත්මක කිරීමට නීතිමය බාධාවක් නොමැති බවත්, එසේ නොමැති නම් සිදුවන්නේ අප සභාවට තිබෙන බලතල අප විසින් අතහැරීමක් බවද පනතේ තිබෙන බලතල අනුව ඕනෑම දෙයක් සඳහා සභාව මගින් තීරණයක් ගත හැකි බවද,ප්‍රදේශයේ ජනතාවක් නියෝජනය කර සභාවට පත්වී ඇත්තේ එක් පක්ෂයකින් නොව පක්ෂ බොහොමයකින් බවත්, ඡන්ද ක්‍රමය අනුව තිබෙන්නේ එක් පක්ෂයක් නම් එම පක්ෂයටද තීරණයක් ගත හැකි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ඉදිරියේදී අතුරු ව්‍යවස්ථාවක් සැකසිය යුතු බවත්, 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත ගැසට් පත්‍රයක් මගින් නාගරික සංවර්ධන අධිකාරී පනත සඳහා ඒකාබද්ධ කර ඇති බවත්, මේ සාකච්ඡා කරන කොටස, පනතින් බලතල තිබුණට දැන් නාගරික සංවර්ධන අධිකාරියට බලය පවරා ඇති බවත්, එමගින් යම් ගැටළුවක් පැමිණිය හොත් පමණක් බාධාවක් ඇති විය හැකි බව තමන් සිතනා බව ද,UD එකෙන් එසේ බාධාවක් ඇති නොවෙයි කියා තමන් සිතන බවත්, අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගෙන මෙම කාර්යය සිදුකරමු, එතෙක් මෙය ක්‍රියාත්මක කිරීමට පනතේ බලය ඇති බවත් වැඩිදුරටත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා.

පොළ භූමියේ බස්රථ ගාල් කළත්, පාසල් ඇරෙන වේලාවට නැවත් බස් රථ පාසල් ආසන්නයට පැමිණිමේදි නැවත මාර්ග තදබදයක් ඇතිවන බවද, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

අප විසින් කුමක් හෝ කාර්යයක් සිදුකිරීමේදී එය විධිමත්ව සිදු කිරීම සුදුසු බවත් පාසල් ආරම්භයේදී විශාල තදබදයක් නොවීමට හේතුව විවිධ වේලාවන් වලදී ළමුන් පාසලට පැමිණීම නිසා වන අතර පාසල අවසන් වීමේදී තදබදයක් ඇතිවීමට හේතුව එකම වේලාවට එකවර ළමුන් විශාල පිරිසක් පිටතට පැමිණීම නිසා වන බවත්, එය ලෝකයේ ඕනෑම රටක සිදුවිය හැකි තත්වයක් බවත්, පැය භාගයන් වගේ තුළ තදබදයක් ඇති විය හැකි බවත්, එම තදබදය වැලක්විය නොහැකි තත්ත්වයක් නිසා එම අතර කාලය තළ එනම් 7.30-1.30 අතර කාලයේදී පාරවල්වල නවත්වා තිබෙන වාහන පොළ භූමියට රැගෙන යාමට කටයුතු කිරීම තුළින්, ආදායමක් ලබා ගැනීමට හා එම වාහන නවැත්වා තැබීම එක තැනකට හුරු කරවීමට අප කටයුතු කළ යුතු බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා පෙ.ව 10.28 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මෙහි වපසරිය, ප්‍රමාණය හා කොපමණ දුරකට විහිදෙනවා ද යන්න පිළිබඳව අතුරු ව්‍යවස්ථාවක් මගින් තීරණය කළ යුතු බවත්, මෙ සභාව විසින් කරන යෝජනාවක් නොවන බවත්, මෙය පාසල් බස් රථ සංගම් මගින්ම කරන යෝජනාවක් බවත්, ඔවුන්ම පොළ භූමියට පැමිණීමට සූදානම්ව සිටියදී ඔවුන්ගෙන් සහන ගාස්තුවක් අය කර ගෙන ඉදිරියේදී පොලිසියත් සම්බන්ධ කර ගෙන ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් මෙම කරුණ සංකීර්ණ කාරණයක් බවට පත් නොකර ගෙන සරල ලෙස ආරම්භ කිරීම සුදුසු බවත් ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

එම ඉල්ලීම පාසල් බස් රථ සංගම්වලින්ම සිදු කරන ඉල්ලීමක් බව ගරු උපසභාපතිතුමා සඳහන් කරන බවත්, එවැනිම ඉල්ලීමක් වන පෝයට කඩ වසා තැබීම සඳහා වෙළඳ සංගමය මගින් සිදු කළ ඉල්ලීමක් සඳහා තමන් විසින් මහ සභාවට යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, නමුත් ඒ සඳහා ලැබුණේ මීට වඩා හාත්පසින්ම වෙනස් තීන්දුවක් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පළමුව අත්හදා බැලීමක් ලෙස මෙම කාර්යය සිදු කරන බවත්, පොළ භූමිය මේ සඳහා ලබාදීමෙන් අනෙකුත් දේ පොලිසිය දැනුවත් කර නතර කිරීමක් මේ මඟින් සිදු නොවන බවත්, මේ සඳහා සීමාවක් කළහොත් ගරු වත්සලා මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ පරිදි ඉඩකඩ ප්‍රශ්නයක් ඇති වන බවත්,මෙ ආරම්භ පියවරක් ලෙස සිදු කරන බවත්, එවිට කැමති පිරිස් පොළ භූමියට පැමිණේවි කියා තමන් බලාපොරොත්තු වන බවත්, පසුව මෙම වාහන නවතා තැබිය

නොහැකි ප්‍රදේශ තහනම් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කළ හැකි බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. සියලුදෙනාම එකවර නතර කළහොත් පොළ භූමියේ ඉඩකඩ පහසුකම් නොමැති වීමේ ගැටළුවක්ද ඇතිවිය හැකි බවද සඳහන් කරන ලදී. මේවන විටද පොළ භූමියට හැරෙන පාරේ මේවන විටත් දැනටමත් තදබදයක් ඇතිවන බවත්, වපසරියක් තීරණය කලහොත් දඩ මුදලකට යෑමට සිදු වන බවත්, එය නීතියක් බවට පත්වන බවත් එසේ වුවහොත් සියලුම වාහන නැවැත්වීම සඳහා පොළ භූමිය ලබාදීමට සිදුවන බවත්, එවිට ඉඩකඩ ප්‍රශ්නයකට මුහුණදීමට සිදුවන බවත්, එම නිසා ඉල්ලීම සිදු කළ පිරිස් සඳහා මෙලෙස ආරම්භයක් ලෙස මුදලක් අයකරන බව පවසා අවස්ථාව ලබාදීම සුදුසු බවත්, මේ අවස්ථාවේ දැඩි තීරණවලට නොයා යුතු බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 10.31 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මෙවැනි යෝජනා ගෙන ඒමට පෙර සාකච්ඡා කළ යුතු බවත්, අතුරු ව්‍යවස්ථාවක් පැනවුවහොත් එය නීතයක් බවට පත්වන බවත්, (ඝෝෂාව) සංවර්ධනය කෙරෙන නගර 10 අතරට ඇහැලියගොඩ නගරයත් සංවර්ධනය වෙනවා නම් මීට වඩා ක්‍රමවත් වැඩසටහන් සකසා ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. මෙවැනි අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුතු බව පැවසූයේ එම රථ ගාල සෑදීමේදී සභාව විසින් අනුගමනය කළ යුතු නීති පද්ධතියක් සකස් විය යුතු නිසා බවත්.එවිට එය නීත්‍යානුකූල නීතියක් බවට පත්වෙලා ඔවුන්ට අධිකරණය දක්වාද යා හැකි බවත් එම නිසා මෙවැනි දේ ගෙන ඒමට පෙර සාකච්ඡාවන් පවත්වා මෙවැනි ස්ථාන වෙත ගෙන ආ යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.විත්තක කරුණාරත්න මැතිතුමා පෙ.ව 10.32 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ඊළඟ කරුණ ලෙස අස්ගහුල උතුර හා දකුණට ගමන් ගන්නා ප්‍රධාන මාර්ගයක් බවත්, හදිසියේ ප්‍රශ්නයක් වුවහොත් එම ස්ථානයේද ගැටළුවක් මතුවන බවත් එසේ කියා මෙම වැඩසටහන නැවැත්විය යුතු නැති බවත් අතුරු ව්‍යවස්ථාවක් යනු නීතියක් බවත් එම නීතිය සැකසීමට පෙර මේ පිළිබඳ වැඩසටහනක් සකසා මෙවැනි යෝජනා ගෙන ආ යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙම යෝජනාව 2026.06.08 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත යොමු කළ යෝජනාවක් බවත් එහිදී එම කාරක සභාවේ සාමාජිකයින් විසින් කාගෙත් අදහස් ,යෝජනා සැලකිල්ලට ගෙන වඩාත් සුදුසු තීරණයක් ලබාගැනීම සඳහා මෙය මහ සභාව වෙත යොමු කළ බවත් එම නිසා මොවුන් විසින් මෙම ඉල්ලීම සිදුකර ඇත්තේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් බවත්, එහිදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සභාව සතුව පවතින පොළ භූමිය ලබාදීමට බලතල නොමැති බැවින් ප්‍රාදේශිය ලේකම්තුමිය අප වෙත ලිපියක් මගින් දැනුම් දුන් බවත්, ඒ අනුව අප විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව යොමු කර, අවසානයේදී මහ සභාව වෙත යොමු කර තීරණයක් ලබා ගැනීම සුදුසු බවට තිරණය කළ බවත්, මෙය නිශ්චිතව ම ලබා දිය යුතුමයි කියා නැති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී. ඒ අනුව ආරම්භයේදී රු. 50.00 ක මුදලක් අයකර පසුව ලබන වර්ෂයේ සිට මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා යොමු විය හැකි බවත්, එම කටයුතු නිරීක්ෂණය කර නීතියක් ලෙස ගෙන ආ හැකි බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු සභාපතිතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය අනුව මෙම ලිපිය මහ සභාව වෙත යොමුකර පිළිතුරක් ලබාගැනීමට ගරු සභාපතිතුමා උත්සාහ කරන බව පෙනීයන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකාශ කිරීමට උත්සහ කළේ මේ කාරණාව සම්බන්ධව කලින් සාකච්ඡාවක් ලබා ගෙන පසුව සභා යෝජනාවක් ලෙස ගෙන ආව නම් සභාවේ කාලයත් ඉතුරු කර ගෙන මේ කාර්ය කළ යුතුව තිබූ බව බවත්, මෙය වරදවා තේරුම් ගත යුතු නැති බවත්, සියලු දෙනාගේම අදහස් රැගෙන වඩාත් හොඳ අතුරු ව්‍යවස්ථාවක් සැකසිය යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

02 (vi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරවර විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි මස 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සබරගමුව පළාතේ ප්‍රාදේශිය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ මෙහි උපලේඛනයේ ඇතුළත් නාමලේඛනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරන බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

03 (i) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා.

අනතුරුදායක ගස් කැපීමට ඉල්ලුම් කිරීමේ දී ගස් ප්‍රමාණය මත ගාස්තුව තීරණය නොකර තනි පරීක්ෂණ ගාස්තුවක් අය කරන ලෙස යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙම කාරණය පිළිබඳව තමන් විසින් 2019.10.08 වසරේ මහා සභාවට මෙවැනිම යෝජනාවක් ගෙන ආ බවත්, 2025 වසර වනතෙක්ම එය ක්‍රියාත්මක වූ බවත්, සභාව නැති කාල සීමාව තුල මෙය වෙනස් වී ඇති බවත්, එක නිවසක කොස් ගස් 05ක් අනෙක් නිවසේ අයිතිය තිබෙන ඉඩමකින් අනතුරුදායක වන අවස්ථාවක, එවිට මේ සභාවට රු.1500.00 බැගින් 05 ක් ගෙවීමට සිදුව ඇති බවත්, නමුත් කාර්මික නිලධාරී මහතා කොස් ගස් 05 ම නිරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා යනු ලබන්නේ එක් දිනයක පමණක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා ප්‍රකාශ කරන්නේ ඒ මතය බවත්, එබැවින් ගස් තිහිපයක් තිබුණද එක නිවසකට එක රු.1500.00 ක මුදලක් පමණක් ගෙවීම සාධාරණ බවත්, එවකට සභාව විසින් ඒ සම්බන්ධව තීන්දුවක් ගෙන තිබූ බවත්,මේ තීරණය වෙනස් වී පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්තුමා හරහා පැමිණි තීරණයකින් එම සභා තීරණය වෙනස් වූ බව තමන් සිතන බවත්, එය අසාධාරණ අය කිරීමක් බවත්, අගතියට පත් පාර්ශවයක් විසින් මේ මුදල් සභාවට ගෙවිය යුතු බවත්, එය ලොකු ප්‍රශ්නයක් බවත්, කලින් සභාවෙන් ගත් තීරණය වෙනස් වීම සම්බන්ධව කරුණු සෙවීමට කාලය මදි වූ බවත්, එම තීරණය දිගටම ක්‍රියාත්මක වීම සඳහා සභා තීරණයක් ගත යුතු බවද මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් තමන් විසින් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමන් වෙත ස්තූතිවන්ත වන වන බවත්, පරීක්ෂණ ගාස්තුවක් ලෙස එක නිවසකට එක ප්‍රමාණයක් තිබිය යුතු බවත්, මේ සඳහා නීතිමය බලපැමක් ඇති බවත්, ඒ සඳහා විසඳුමක් සෙවිය යුතු බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා.

මාහර තලගහමුල මුන්ටාස් කියන මහත්මියකගේ නිවසක මෙවන් ගැටළුවක් මතුව තිබෙන බවත්, මේ සම්බන්ධව කීපවතාවක් ම සභාවට දැන් වූ බවත්, කාරක නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සභාපති වන ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා දමේ සම්බන්ධව දැනුවත් කළ බවද, මේ සම්බන්ධයෙන් කඩිනම් තීරණයක් ගත යුතු බවටත්, දවසින් දවස එම ප්‍රශ්නය ඔඩු දුවන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා

ගස් කැපීම සම්බන්ධව ගැටළු කිහිපයක් පවතින බැවින්, ගස් කැපීම සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන් කීපදෙනෙක් මේ සඳහා බඳවා ගැනීමට කටයුතු කළ බවත්, අනතුරුදායක ගස් විශාල ප්‍රමාණයක් මේ වන විට තිබෙන බවත්, ඉදිරියට එම කොන්ත්‍රාත්කරුවන් මාර්ගයෙන් ඒ වැඩකටයුතු කර ගැනීමට හැකි වන බවත් ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එක වත්තක ගස් කිහිපයක් තිබුණත් එකක් තිබුණත් රුපියල් 1500.00 ක් අය කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව ගරු සභාපති බන්ධුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්ත කරුණාරත්න මැතිතුමා.

අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍රයේ ග්‍රම නිලධාරීවරයාගේ සහතිකය ලබා ගැනීමඅවශ්‍ය බව සඳහන්ව ඇති බවත්, අනතුරුදායක ගස් ඉවත් කිරීමේ බලය තිබෙන්නේ ප්‍රාදේශිය සභාවට බැවින් එලෙස ග්‍රාම නිලධාරීවරයාගේ සහතිකයක් ගනු ලබන්නේ ඇයිද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්ත කරුණාරත්න මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ප්‍රාදේශිය සභාවට නිශ්චිතව ම නිර්දේශය ලබාදීමට නොහැකි අවස්ථාවල, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිශ්චිතවම එක් ගමකට ග්‍රාම නිලධාරී මහතෙක් සිටින බැවින්, ඉඩම් ආරවුල්, නඩු සහිත ඉඩම් වැනි ගැටළු සහගත ස්ථාන වලින් පැමිණිලි පැමිණීමේදී එය නිරාකරණය කර ගැනීමට එසේ අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍රයේ ග්‍රම නිලධාරීවරයාගේ සහතිකය පිළිබඳව සඳහන්ව තිබීම පහසු වන බව ගරු සභාපතිතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා විසින් ප්‍රායෝගික යෝජනාවක් ගෙන ආ බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් මන්ත්‍රීතුමා පැවසූ පරිදි 2019 වසරේදීත් මේ පිළිබඳව කථා කළ බවත් එහිදී හිටපු ප්‍රාදේශිය ලේකම්තුමා විසින් ප්‍රාදේශිය සභා පනතින් එම බලය ඉවත්කර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත අනතුරුදායක ගස් කැපීමේ බලතල ලබා ගැනීමට යෝජනාවක් ගෙන ආ බවද එහිදී ඒ සඳහා එකල මහ සභාව විසින් විරුද්ධත්වය ප්‍රකාශ කළ බවත් ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට යොමුකර විෂයභාර පාර්ලිමේන්තු ඇමතිවරයා හරහා එම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලෙස යෝජනාවක් සම්මත කරගත් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් වැඩිදුරටත් සඳහන් කර අතර, එම නිසා යම් යම් ස්ථාන වල අප ප්‍රාදේශිය සභා පනතේ බලය හැල්ලු කරන නිලධාරීනුත් සිටින බැවින් හා එවන් බලපෑම්ද ඇති වන බැවින් ඒ පිළිබඳවත් අවබෝධයෙන් සිටිය යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

04 (i) ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

වියලගොඩ හරහා යන මාහිංගොඩ පුවක්ගස්දෙනිය මාර්ගය බැකෝ යන්ත්‍රය යොදවා කාණු ගොඩ දමා මාර්ග උරහිස් සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථීර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

04 (ii) ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

මාහිංගොඩ සමන්පෙදෙස හරහා වියලගොඩට පිවිසෙන මාර්ගය බැකෝ යන්ත්‍රය යොදවා සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථීර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

04 (iii) ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

නාකන්දල ගම හරහා වැටී ඇති වැලි පාරේ නාකන්දල කොටස බැකෝ යන්ත්‍රය යොදවා කාණු ගොඩ දමා මාර්ග උරහිස් සකස් කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05 (i) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

2020.08.20 දින මුදල් අමාතයාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව අනුව මු.රෙ 371(2) (අ) සුළු මුදල් අතුරු අග්‍රිමය රුපියල් 25,000.00 ක උපරිමයක් දක්වාත් එක් වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය හැකි උපරිම සීමාව රුපියල් 5,000.00 නොයික්මවන පරිදි ගෙවීමට සංශෝධනය කර ඇත.

එසේ වුවද ප්‍රාදේශිය සභා මුල්‍ය රීති අනුව මේවන විට සුළු මුදල් අග්‍රිමය ලෙස භාවිතා කිරීමට ලබා දී ඇත්තේ රුපියල් 1,000.00 ක් වන අතර එයින් එක් වරකට එක් අවශ්‍යතාවයකට ගෙවිය හැකි උපරිම සීමාව රුපියල් 100.00 ක් හෙයින්, පවත්නා ආර්ථික තත්ත්වය අනුව වියදම් දැරීම සඳහා මෙම මුදල ප්‍රායෝගික නොවන බැවින් සුළු මුදල් අග්‍රිමය රුපියල් 20,000.00 ක් දක්වා වැඩි කිරීමටත් එක් වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය යුතු උපරිම සීමාව රුපියල් 1,000.00 දක්වා වැඩි කිරීමටත් අනුමත කිරීම සුදුසු බවත් සුළු මුදල් අග්‍රිමය තබා ගැනීම සඳහා සරප් විෂයභාර කළමනාකරණ සේවා නිලධාරි පී.එස්.ඒ එස්.සෝමරත්න මිය වෙත බලය පැවරීම සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙම ගැටළුව කාලය සිට පවතින ගැටළුවක් බවත් මෙය සභාවේ කාර්යක්ෂමතාවට ද බලපාන බවත්, මෙහි රුපියල් 1000.00 කින සීමාවද වැඩි කර මෙම මුදල රු.1500.00 ත් රු.2000.00 ත් අතර ප්‍රමාණයක් තබාගත හැකි නම් කාලයත් සමඟ මෙය වඩාත් යෝග්‍ය වන බවත්, එවිට රු.20000.00 කින් වාර 10ක් රු.2000.00බැගින් ගෙවීම් කළ හැකි බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සභා වාහනයක ටැයර් එකක පැච් එකක් දමන් ගිය විටත් ඒ අවස්ථාවේ ම ගෙවීම් කිරීමට නොහැකි නිසා සභා වාහනයක් කිවු විට කරන් නැති තත්ත්වයක් පවතින බවත්, එම තත්ත්ව සැලකිල්ට ගෙන මෙසේ මුදල රුපියල් 1000.00 සීමාව දක්වා වැඩි කිරීමට සිතු බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගසක අත්තක් කැපීමේදී රු.1000.00 කින් හෝ රු.2000.00 කින් එම කාර්යය සිදුකර එවලෙහිම සුළු මුදල්වලින් ගෙවීමට හැකි වන බවත්, එය රුපියල් 2000.00 ක් කර ගැනීමේ වටිනාකමක් ඇති බවත්, එය මිනිසුන්ගේ පැත්තෙන් හොඳ දෙයක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා තලගහමුල ප්‍රදේශයේ ගසක ප්‍රශ්නයක් දිගින් දිගටම කතා කරන බවත්, එවැනි අවස්ථාවක එය රුපියල් 2000.00 කින් වගේ සිදු කර ගැනීමට හැකිනම් එවැනි අවස්ථාවකදී මෙය ප්‍රයෝජනවත් වන බවත්, චෙක්පත් ලබා දීම හරියන් නැති විටක එම පුද්ගලයාට මුදල් ලබාදිය හැකි නම් එම කාර්යය වඩාත් සාර්ථක වන බවත්, එබැවින් එම මුදල වැඩි කිරීම ගැටළුවක් නොවන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

සම්බන්ධව නීත්‍යානුකූල පැතිකඩක් ඇති බව අපි දන්නා බවත්, ඒ සඳහා කමිටු රැස් වෙන්න ඕන , මුදලක් වෙන් කරන්න ඕන, එවැනි කාරණා නිසා මෙය එකපාර කළ නොහැකි කාර්යක් කියා අප දන්නා බවත්, එවැනි අවස්ථාවල ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත්, නැතහොත් වැරදිමතයක් සමාජගත වන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා විසින් මතු කරන ගැටළුව රුපියල් දෙදහසකින් තුන්දහසකින් විසඳිය හැකි ගැටළුවක් නොවන බවත්, දුරකතන රැහැන් එක් පැත්තකින් හා විදුලි රැහැන් එම ගස් අතරින් ගමන් කරන බවත්, ඒ නිසා එය ඉතා පහසුවෙන් කළ හැකි කාර්යක් නොවන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එවන් ගැටළු රාශියක් පවතින බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී සාකච්ඡා කරනු ලැබුවේ ක්ෂණිකව වියදම් කළ හැකි මුදල පිළිබඳව බවත් එහිදී මෙතුවක් කාලයක් පැවතියේ ළඟ තබාගත හැකි මුදල රු. 1000.00ක් පමණක් බවත් වියදම් කළ හැකි මුදල රු. 100.00 ක් බවත් ඒ අනුව එම සුළු මුදල් අග්‍රිම මුදල වැඩි කර ගත යුතු බවත් ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව සුළු මුදල් අග්‍රිමය රුපියල් 20,000.00 ක් දක්වා වැඩි කිරීමටත් එක් වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය යුතු උපරිම සීමාව රුපියල් 1,000.00 දක්වා වැඩි කිරීමටත් අනුමත කිරීම සුදුසු බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

05 (ii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/SG/0304 හා 2016.12.15 දිනැති ලිපියෙන් කොන්ත්‍රාත් පදනමින් බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක් අනුමතව ඇතත්, එම තනතුර මේ වන තෙක් පුරප්පාඩුව පවතී.2026.06.26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ තීරණය අනුවද ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගැනීම සුදුසු බවට තීරණය කර ඇති බැවින් එම පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් අයෙකු බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සභාව සතු බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සිදු කර මේවන විට ක්‍රියා කිරීමට සුදුසු තත්වයේ පවතින බවද එය අලුත්වැඩියා කිරීමට එකඟ වූ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වන බවද, බැකෝ යන්ත්‍රය සඳහා නිත්‍ය රියදුරෙකු අවශ්‍ය බවත්, ඒ අනුව හොඳ බැකෝ යන්ත්‍රයක් සභාව සතුව මේවන විට ඇති බැවින් ඕනෑම වසමක ඕනෑම කොට්ඨාශයක වැඩ කටයුතු සිදු කළ හැකි බවත් ඒ සඳහා නිශ්චිත පළපුරුදු රියදුරු මහතෙක් අවශ්‍ය බැවින් මෙම යෝජනාව ගෙන ආ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

05 (iii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ටිපර් රථය ද ඇතුළුව වාහන සංඛ්‍යාව 14 කි.සභාවේ ටිපර් රථය සඳහා ස්ථිර රියදුරෙකු නොමැතිවීම විශාල ගැටලුවක් බැවින් පවතින සේවා අවශ්‍යතාවය මත 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 19 (i) වගන්තිය ප්‍රකාරව මෙම සභාවේ ටිපර් රථය වෙනුවෙන් මු.රෙ 71 යටතේ රියදුරු තනතුරක් ඇති කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

බැකෝ යන්ත්‍රය සඳහාද රියදුරු මහතෙක් නොමැති බැවින් වාහනයට ආදරය කරන පළපුරුදු රියදුරු මහතෙක් සිටී නම් ඒ සඳහා සම්බන්ධ කරන ලෙසට ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් විවෘත ආරාධනයක් සිදු කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

05 (iv) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

2024.06.29 රාජකාරියේ යෙදී සිටියදී සෞඛ්‍ය කම්කරු එච්. සුමිත්‍රපාල මහතා හදිසි අනතුරකට ලක්ව ඇත.

එබැවින් එයට අදාළ හදිසි අනතුරු වන්දි ගෙවීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව ඔහුගේ දස මසක වැටුපෙන් 10% ක මුදලක් ගෙවීමට පළාත් වන්දි කමිටුව තීරණය කර ඇත.

ඒ අනුව රුපියල් 24,250.00 ක මුදලක් ඔහුට ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

05 (v) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි පහත සඳහන් වීථි පහන් මිලදී ගැනීම වෙනුවෙන් පළමු හරස් වීදිය, කොළඹ 11 හි පිහිටි යූ.කේ.ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය ට රුපියල් 3,577,750.00 ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

- 150 w LED street Light -ප්‍රමාණය 250 -රු.2,562,500.00
- 18 w LED Bulb -ප්‍රමාණය 500 -රු. 880,000.00
- 1/044 wire Roll -ප්‍රමාණය 05 -රු. 32,500.00
- Thambler swich -ප්‍රමාණය 250 -රු. 73,750.00
- Holder Black -ප්‍රමාණය 300 -රු. 28,500.00
- Tape Roll -ප්‍රමාණය 05 -රු. 500.00

රු .3,577,750.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

05 (vi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දෙවන අදියරේ නාම ලේඛනය සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.(ඇමුණුම xiii)

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 10.56 ට සභා ගර්භයෙන් පිට විය.

05 (vii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

බෙරුවාන කසල අංගනයේ පිරි තිබූ කසල තොගය 2026.03.18 දින සිට 2026.04.01 දින දක්වා කාලයේ ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා කසල ඉවත් කිරීම සිදු කරන ලදී.එම සේවා ලබා ගැනීමේ ලංසු 2026.03.09 වන දින විවෘත කරන ලද අතර එදිනට ඩිසල් ලිටරයක් රුපියල් 281.00 ක් ලෙස වෙළඳපොල තුළ පැවතුණි.2026.03.09 වන දින ඩිසල් ලීටරයක් 303.00 දක්වා හා 2026.03.21 දින ඩිසල් ලීටරයක් රුපියල් 382.00 ක් දක්වා ඉහළයාමත් සමඟ යන්ත්‍රය ක්‍රියා කරවීමට ඩිසල් යෙදවීම වෙනුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදු වූ බව පවසමින් කර්මාන්තය ක්‍රියාත්මක කළ ඩික්ටෝ එන්ටර්ප්‍රයිසස් ආයතනය, ඇරැපොල , ඇහැලියගොඩ.වෙතින් කරන ලද ඉල්ලීම සලකා බලා වෙළඳපල ඩිසල් මිල වැඩි වීම නිසා සිදුව ඇති පාඩුව වෙනුවෙන් රුපියල් 57,461.60 ක මුදලක් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

එම යෝජනාව සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර සිටින බවත්, අදාළ ගිවිසුමේ මිල ගණන් වැඩි වුවහොත් ගෙවීම් කටයුතු සිදු කරනවා ද යන්න පිළිබඳවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙය මුදල් හා ප්‍රතිපත්තිකාරක සභාවට යොමු කළ යෝජනාවක් බවත්, කාරක සභාවෙන් තීරණයක් නොගෙන සභාව යොමු කළ තීරණයක් ගත යුතු යැයි එහිදී තීරණය කළ බවත්, එලෙස ගිවිසුමේ සඳහන් නොවන බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගිවිසුමේ නොමැති නම් මෙම යෝජනාව අනුමත කළ නොහැකි බවත් එසේ සිදු කළහොත් වැරදි පූර්වාදර්ශයක් වන බවත්, දිගින් දිගටම සිදුවන මිල ගණන් උච්චාවචනයන් සමඟම එසේ වුවහොත් කිසිදු කාර්යයක් සිදු කර ගැනීමට නොහැකි වන බවද, මෙය ලීටර් ගාණනකට ගෙවීම් සිදු කරන කාරණාවක් නොවන බවත්, මෙය සේවය සපයන පැය ගණනට ගෙවීම් සිදු කිරීමක් බවත්, මේ සඳහා විපක්ෂ කණ්ඩායම ම විරුද්ධ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සඳහා විපක්ෂ කණ්ඩාම පමණක් නොව තමන් ද මේ සඳහා විරුද්ධ බවත්, සියලු දෙනා විරුද්ධ නිසා මෙය සභාවට යොමු කළ බවත්, ඒ නිසා මේ සඳහා කිසිදු සංවාදයක් විය යුතු නැති බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සඳහා සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව විරුද්ධ විය.ඒ අනුව අදාළ යෝජනාව සම්මත නොවිනි.

05 (viii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ප්‍රාදේශිය සභාව සතු ZA-5083 බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කරවා ගැනීම වෙනුවෙන් ඇවොස්මාට් ඉන්ජිනියරින් ආයතනය වෙත පහත සඳහන් ගෙවීම් කිරීම සුදුසු බව යෝජනා කරමි.

- ඇස්තමේන්තු ඇත 013937/001 අනුව -රු.1,962,900.72
- ඇස්තමේන්තු ඇත 014291/011 අනුව -රු.474,161.00 (අතිරේඛ ඇස්තමේන්තුව)

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සහ සම්මත විය.

05 (ix) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි තත්ත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරු ලෙස සේවයේ යොදවා ගෙන ඇති ආර්.ඉන්දික සම්පත් ජයසේන මයා සමඟ එළඹී සේවා ගිවිසුම 2026.07.28 දිනෙන් අවසන් වේ.එබැවින් සේවා අවශ්‍යතාවය මත 2026.08.01 දින සිට නැවත මාස තුනක කාලයක් සඳහා ගිවිසුම්ගත වීමට හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2025 හි අනු අංක 16 පරිදි වේතන ගෙවීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05 (x) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන්ගෙන් රාජකාරී වෙලාවෙන් පසු පොහොර කිලෝ 01 ක් හැලිම වෙනුවෙන් රුපියල් 8.00 ක මුදලක් ගෙවීමටත්, පොහොර හලා ඇති ප්‍රමාණය අනුව මාසය අවසානයේ ගෙවීම් කිරීමටත් මුදල් කමිටුව තීරණය කරන ලදී.ඒ අනුව ගෙවීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.

රජකාරී වේලාව තුළ ඔවුන්ගේ උපරිමය ලබා ගැනීමට ඉලක්කයක් (ටාගට්) ලබාදී තිබෙනවාද? යන්න පිළිබඳව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් විමසා සිටින ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙම යෝජනාව මුදල් කාරක සභාවේදී පැමිණි බවත්, ඒ සඳහා සේවකයින් අඩු බව හා කාර්යක්ෂමව මෙම කාර්යය සිදු කළ යුතු නිසාත් ඔවුන්ගේ වේතනයට අමතරව අතිකාල වැඩ කරන අයට රු. 8.00 ක මුදලක් ලබා දෙන බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.මෙමගින් ලාභයක් නොලැබෙන බවත් ලාභයක් ලබාගැනීමේ අරමුණට වඩා ගොඩ ගැසී ඇති කසළ ප්‍රමාණය අඩුකර ගැනීමත් පොහොර ලබා ගැනීමත් මෙහි අරමුණ බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05.(xi) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 21(1) වගන්තිය ප්‍රකාරව වෙනත් යම් අධිකාරියට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම්වලට යටත්ව ප්‍රාදේශිය සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රධාන මංමාවත් නොවන සියලු මංමාවත් සහ මාර්ග සම්බන්ධතා පිළිබඳ කාර්ය සඳහා සාමාන්‍ය පරිපාලන අධිකාරිය ප්‍රාදේශිය සභාව වේ.එමෙන් ම එකී පනතේ 23 වගන්තිය ප්‍රකාරව යම් ප්‍රඥප්තියක් ප්‍රකාරව දැනටමත් පැවරී ඇත්නම් හැර, ප්‍රධාන මංමාවත් නොවන යම් ප්‍රදේශයක් තුළ පිහිටා ඇති වෙනත් සියලු මංමාවත් ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු වේ.ඒ ආකාරයට ප්‍රාදේශිය සභාව සතු වී ඇති මාර්ග සංවර්ධනය කිරීමේදී අන්තර් ගම්මාන යා කෙරෙන මාර්ගයක කොන්ක්‍රීට් ඇතිරීම, කාපට් ඇතිරීම, තාර යෙදීම යන කාර්යක දී තිබිය යුතු අවම පළල අඩි 12 හෝ ඊට වැඩි විය යුතු අතර, ගම තුළ ඇති අනෙකුත් ජනපදයේ පිහිටා ඇති මාර්ගවල ඉහතින් සඳහන් සංවර්ධන කාර්යක දී තිබිය යුතු අවම පළල අඩි 10 හෝ ඊට වැඩි විය යුතු අතර, වීදි හෝ අතුරු මාර්ගවල ඉහතින් සඳහන් සංවර්ධන කාර්යක දී තිබිය යුතු අවම පළල 08 ක් හෝ ඊට වැඩි වන ලෙස තබා ගනිමින් සංවර්ධනය කළ යුතු බවත්, නාගරික සංවර්ධන අධිකාරී පනත හෝ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත මඟින් අනුමැතිය ලබා දෙන ඉඩම් කට්ටි කැඩීමකදී, එකී පනත්වල නියමයන් පරිදි අදාළ මාර්ගවල පළල තිබිය යුතු බවටත් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් තීරණය කළ යුතු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.06 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය පෙ.ව 11.06 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මං මාවත් සම්පූර්ණ ප්‍රාදේශිය සභාව යටතේ ඇති බවත්, නමුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා නිලධාරීන් සභාවේ කිසිම අනු දැනුමකින් තොරව මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කළ බවත්, මේ සම්බන්ධව සම්බන්ධිකරණ රැස්වීමේදී ද සාකච්ඡා කළ බවත්, අඩි 10 ක් 12 ක් 16 ක් තිබෙන මාර්ග අඩි 8 ක් සංවර්ධනය කිරීමට තීරණය කළ බවත්, එසේ සිදු කිරීමෙන් දෙපැත්තේ ඇති කම්බි වැටවල් පාරට එන බවත්, එවිට මාර්ගය පටු වන බවත්, ඒ තත්ත්ව විශේෂයෙන් ම ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා සිටින යකුදාගොඩ ප්‍රදේශයේ ගොඩක් තැන්වලින් පැමිණිලි ලැබුණ බවත්, ඒ හේතුවෙන් වාහනයක්වත් ගමන්ගැ නීමට නොහැකි බවත්, ඒ නිසා මේ මාර්ග සම්බන්ධව සභාවක් විදිහට මෙවැනි තීරණයක් ගත යුතු බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

පාර අඩි 16 ට 12 තිබූ පාරවල්වල කොන්ක්‍රීට් එක අඩි 8 ට යොදන බවත්, ඉන්පසු වැටවල් අඩි 8 සීමාවට පැමිණෙන බවත්, එසේ සිදු විට පාරවල් පුළුල් කිරීමට යෑමේ දී ලොකු ගැටලුවක් වන බවත්, ඒ නිසා අඩි 8 ට හෝ අඩි 10 ට කොන්ක්‍රීට් කර මාර්ග සංවර්ධනය කරනව නම්, සභාවේ සිටින කාර්මික නිලධාරී මහතෙකු එම ස්ථානයට ගොස්, මේ පාරේ ප්‍රමාණය මෙපමණ බවත්, පසුව වැට පාර දක්වා පැමිණිය නොහැකි බවට දැනුවත් කළ යුතු බවත්, අඩි 8 ට සංවර්ධනය කළ මාර්ගයක වැට මාර්ගය දක්වා පැමිණීමෙන් වාහන දෙකක් මාරුවීමටද නොහැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම නිසා සභාවේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරී මහතුන් සාකච්ඡා කර පාරේ ප්‍රමාණය නිශ්චිත කිරීමක් කරන වැඩපිළිවෙළක් තිබිය යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා කළේ අඩි 10,15,16,20 තියෙන පාරවල් තිබෙන බවත්, එම පාරවල්වලදී අඩි 8 යෝජනා කිරීම සිදු නොකළ යුතු බවත්, එම අඩි 8 ගත යුත්තේ X කියන පාරේ වම්පසින් හෝ දකුණු පසින් අපට අඩියක්වත් ගැනීමට නොහැකි නම් පමණක් අඩි 8 ට යා යුතු බවත්, යකුදාගොඩ වසමෙන් එවැනි ප්‍රශ්න තිබෙන බවත්, ඒ සඳහා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා සාක්ෂි දරන බවත්, බුළුගහපිටිය වසමේ සමහර පාරවල් අඩි 24, අඩි 20 විදිහට සාදා ඇති බවත්, අඩි 12, 16 තිබෙනවා නම් මේක 2012 හරි 2013 හරි අධිකරණ නියෝගයකුත් තිබෙන බවත්, එහි සඳහන් වෙනවා අවම පාරක් අඩි 12 වියතු බවත්, ඒ නිසා අඩි 8 පාරවල් අඩි 10 පාරවල් සෑදිය යුත්තේ දෙපසින් ඉඩම් ලබා ගැනීමට නීතිමය බාධාවක් හෝ ගැනීමට ඉඩක් නැත්නම් හෝ වෙනත් කාරණාවක් මත පමණක් බවත්, සටහන් විය යුතුයි සටහනේ. නැත්නම් අනිවාර්යෙන් ම අඩි 12 හෝ අඩි 12 ට වැඩි විය යුතුයි. එය අප කාගේත් අදහස බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධ ලොකු සංවාදයක් ගිය බවත්, ඒ සඳහා තමන් පුද්ගලිකව මැදිහත් වූ බවත්, ප්‍රාදේශිය ලේකම් කාර්යාල නිලධාරීන් ඒ සඳහා කැමති නොවූ බවත්, සම්බන්ධීකරණයේ දී සභා පනතේ නීතිත් සමඟ අපේ සභා ලේකම්තුමත් පැහැදිලි කිරීමක් කළ බවත්, සභාවෙන් ගත් මේ තීරණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත යොමු කරන බවත්, එවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන්ට සභාවේ අනුමැතියක් නොමැතිව මේ කාර්යන් සිදු කළ

නොහැකි බවත්, ප්‍රාදේශිය ලේකම් කාර්ය මණ්ඩල සංවර්ධනය කරන පාරවල් ද මේ නිතිය අනුව සිදු කළ යුතු බව ද ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය.

මීටිපොල පන්විල මාර්ගයද අඩි 8 ට සංවර්ධනය කළ ඇති බවද එය අඩි 10 ට සංවර්ධනය කිරීමට හැකියාව තිබූ බව ද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එම මාර්ගය සංවර්ධනයෙදී තමා මේ ප්‍රශ්නය ඇදී ආ බවත්, ඒ සඳහා තමන් තදින් ම විරුද්ධ වූ බවත්, වාහනයක් ආ විට යාමටද අපහසු බවත්, පාර තිබුණ ප්‍රමාණයට පාර සකස් කළ බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිටි නිලධාරීතුමිය ප්‍රකාශ කළ බවත්, අඩි 3 පාරක් තිබූ විට අඩි 3 ට සකස් කරනවා ද යන්න තමන් විසින් එම නිලධාරීතුමියගෙන් ප්‍රශ්න කළ බවත්, ඒ අවස්ථාවේ නිලධාරීතුමිය නිරුත්තර වූ බවත්, පාර සැහෙන කොටසක් සකසා ඇති නිසා ඒ මාර්ගය පමණක් එසේ සකස් කිරීමට අවස්ථාව දුන් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය පෙ.ව 11.11 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සිදු කරන පාරවල් සඳහා පාරේ දිග පළල සහිතව ඔවුන්ගේ ඇස්තමේන්තුව සභාවට යොමු කර අවසරයක් අරන් සකස් කිරීමට නොහැකිද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් විමසා සිටින ලදී.

තමාට වූ සිද්ධියක් අනුව මෙය ප්‍රකාශ කරන බවත්, පාරේ මුල සිට අඩි 8 ට සකසා ඇති පාරක, තව මීටර් 300 ක් පමණ සංවර්ධනය කිරීමට ඇති කොටසක, එම කොටස අඩි 10 ට කිරීමට තේරුමක් නැති වන බවත්, ඒ සඳහා කුමක් කළ යුතු ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍ර විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.12 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

එම වැරැද්ද නැවත සිදු කළ යුතු නැති බවත්, එය අඩි 10 ට කරන ලෙසත්, ගරු සුජීව මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ පරිදි සමහර තැන් අඩි 12 වෙන්න පුළුවන් බවත්, සමහර තැන් අඩි 12 වැඩි වීමට හැකි බවත්, අඩි දහයම කියා නැති බවත්, අඩුම තරමේ දහයක් පමණවත්, විය යුතු බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05.(xii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් අංක 2412/01-2024.11.25 වන දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති භාණ්ඩ වැඩ උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 හි 3.1.9 වැඩ කොන්ත්‍රාත් සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීමට අදාළව එහි (ඇ) යටතේ වැඩ කොන්ත්‍රාත්තුවක් ප්‍රජාපාදක සංවිධානයේ විෂය පථයට අනුකූල විය යුතු බවට සහතික කිරීම, අදාළ අධිකාරියේ වගකීමක් බව දක්වා ඇත.

ඒ අනුව එයට අනුගත වී ප්‍රාදේශීය සභා අරමුදල් හෝ වෙනත් ප්‍රභවයකින් අරමුදල් යොදවා සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී අදාළ විෂය පථයට අනුකූල වන ප්‍රජාපාදක සංවිධානයක් මඟින් කොන්ත්‍රාත් වැඩ සිදු කර ගත යුතුව ඇත.එසේ වුවත් එවැනි ප්‍රජාපාදක සංවිධාන ඉදිරිපත් නොවන අවස්ථාවක දී ප්‍රාදේශීය ලේකම් හෝ වෙනත් බලධරයෙකු විසින් හැකියා සහතික නිකුත් කර ඇති ප්‍රජාපාදක සංවිධානයක් සඳහා අදාළ කමිටුවේ නිර්දේශ මත ගිවිසුම්ගත වීමට අනුමැතිය ලබා දීමට සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

අලුතින් ඒ වා ඇති ගැසට් පත්‍රයේ කොන්ත්‍රාත් ලබා දීමේ දී ප්‍රජාපාදක සමිතිවලට කොන්ත්‍රාත් ලබා දීමේ දී විෂයපථයට අනුගත විය යුතු බව දන්වා ඇති අතර, ග්‍රාම සංවර්ධන සමිති මේ සඳහා කිසිදු ප්‍රශ්නයක් නොමැති බවත්, සංවර්ධන කියන නාමය එහි ඇති බවත්, නමුත් පසුගිය කාලයේ ගොවි සමිති වැනි සුභසාධක සමිති සඳහා ලබා දුන් බවත්, ගැසට් එකේ සඳහන් ඇත්තේ එවැනි සමිති සඳහා නොදී අදාළ විෂයපථයට අයත් සමිති සඳහා දිය යුතු බව සඳහන් කර ඇති බවත්, වසම්වල ග්‍රාම සංවර්ධන සමිති බොහොම ටික ප්‍රමාණයක් පවත්න බවත්, එසේ වුවහොත් මේ කාර්යන් සිදු කර ගැනිමට නොහැකි වන බවත්, ඒ නිසා මෙ සම්බන්ධව තමන් විසින් තනි තීරණයක් නොගෙන මෙ සභාවට යොමු කළ බවත්, වැනි ග්‍රාම සංවර්ධන සමිතියක් නැත් නම් ප්‍රාදේශි ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති හැකියා සහතිකයක් ලබා ගත හැකි සමිතියක් හරහා මෙය සිදු කිරීම සුදුසු බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා පෙ.ව 11.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගැසට් එක ලැබුණු එක හොඳ දෙයක් බවත්, සභාවට පැමිණ පළමු මාසෙ ම පැල්පිටියේ පාරක් සැකසීමට යෝජනා වී තිබූ බවත්, පැල්පිටිය ග්‍රාම සංවර්ධන සමිතිය එය අත්සන් කළ බවත්, නමුත් උපසභාපතිතුමා මැදිහත් වී එය ග්‍රාම සංවර්ධන සමිතියෙන් ඉවත් කර විවිධසේවා සමුපකාර සමිතියට එය අරන් දුන් බවත්, ඒ වන විට ගැසට් එක ඇවිත් තිබුණනම් පැල්පිටිය ග්‍රාම සංවර්ධන සමිතියට එය හිමිවන බවත්, ගැසට් එක නාවත් එය ගමේ සමිතියක් ගමේ ව්‍යාපෘතියක් කරන්න ඕනේ ගමේ සමිතියක්.නමුත් එදා තමුන්ගේ දේශපාලන උවමනාවන් ඉටු කර ගැනීමට උපසභාපතිතුමා එසේ ක්‍රියාකරන්නට වුවා කියා තමන් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.17 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මේ යෝජනාව හොඳ බවත්, මෙය අධ්‍යනය කරන්න තව කාල සීමාවක් තිබුණනම් තවත් හොඳ බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.17 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙහි ඇති වර්ග කිරීම්වලින් ප්‍රමුඛතාව ලබා දෙන්නේ ග්‍රාම සංවර්ධන සමිතියට බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.18 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගික තත්ත්වයන් වලට මුහුණ දීමට සිදුවන බවත්, සමහරවිට ග්‍රාම සංවර්ධන සමිතියක් නැතිවෙන්නත් පුළුවන් බවත්, ඒ අවස්ථාවක කටයුතු කළ යුත්තේ කුමන ආකාරයෙන් ද යන්නත්, මෙන්න මේ වගේ ව්‍යාපෘතියක් ඇවිත් තිබෙනවා ඒ සඳහා ඔබලාගේ අදහස කුමක්ද යන්න විමසා සිටිය යුතු බවත්, උදාහරණයක් ලෙස ඇළ මාර්ගයක් සුද්ද කිරීමේ ව්‍යාපෘතියක් ආවොත්, එය ගැසට් එක අනුව ගොවි සමිතියකට සිදු කිරීමට හැකි බවත්, හැබැයි ගොවි සමිතියක් නැත් නම් ඒක ග්‍රාම සංවර්ධන සමිතිය දැන ගන්න ඕන මෙන්න මෙහෙම ව්‍යාපෘතියක් ගමට ඇවිත් තියෙනවා කියලා. මේක කරන්න ඉඩ දෙන්න කියලා.නැත්තන් වෙනම ටෙන්ඩර් දාලා වෙන ආයතන විසින් ක්‍රියාත්මක කරීමට පුළුවන් බවත්, ගමට ව්‍යාපෘතියක් එන විට ගමේ ස්වේච්ඡා සමිතිවලට දැනුම් දීමේ ක්‍රමවේදයක් තිබිය යුතු බවත්, එයාලගේ විෂයපථයට අදාළ නම් එයාලට කිරීමේ හැකියාවක් තිබිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 11.19 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.

තමන් නියෝජනය කරන කොට්ඨාශය තුළ ග්‍රාම සංවර්ධන සමිති දෙකක් තිබෙන බවත්, දෙකම බලැක්ලිස්ට් බවත්, ඒ නිසා දැන් ව්‍යාපෘතියක් කර ගැනීමට නොහැකි බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා පෙ.ව 11.20 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
ගරු මන්ත්‍රීතුමා බලැක්ලිස්ට් දාලා තියෙන්නේ කවුද යන්න ගරු සභාපතිතුමා විමසන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා පෙ.ව 11.21 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා පෙ.ව 11.21 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.

2019 වගේ ප්‍රජා ශාලාවක් ඉදි කර ඇති බවත්, එම ගොඩනැගිල්ල දැන් කඩා ඉවත් කර ගැනීමටත් දාල තිබෙන බවත්, එම සමිති දෙක එක්ව මේ ව්‍යාපෘතිය සිදු කර ඇති බවත්, දැන් ඒ සම්බන්ධව පර්යේෂණයක් සිදු කර ඇති බවත්, තමන් බලයට පත් වූ පසු නැවත ග්‍රාම සංවර්ධන සමිතියක් පිහිටවූ බවත්, එම සමිතිවලට දැන් ආයෙ කොන්ත්‍රාත් එකක් ගැනීමට නොහැකි බවත්, අමාත්‍යාංශයට මේ සම්බන්ධව වෙන ම ඉල්ලීම් සිදු කර ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සභාවෙන් අසාධු ලේඛනගත කිරීමක් සිදු කර නොමැති බවත්, ඒ නිසා සභා යෝජනා සිදු කිරීමට හැකි බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අසාධු ලේඛනයේ තිබෙන බැවින් හැකියා සහතික නොදෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේවන විට අවලංගු කිරීමක් සිදු කර ඇත්තේද යන්නත්, අවලංගු කර ඇතිනම් එය ප්‍රශ්නයක් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.

මේවනවිට අවලංගු කර ඇති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.

එම ස්ථානයේ අවිධිමත් සංවර්ධන කටයුත්තක් සිදු වී ඇති බවත්, එම ව්‍යාපෘතිය ඒ සමිති හරහා සිදු වී ඇති බවත්, ඒ සඳහා මේ වනවිට විනය ක්‍රියාමාර්ග සිදු වෙමින් පවතින බවත්, ඒ හේතුව මත සමිති බ්ලැක්ලිසිට් වී ඇති බවත්, දැනට ඒ නිලධාරී මණ්ඩලය සමඟ එම සමිතිවලට ව්‍යාපෘති දීමේ හැකියාවක් නොමැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.22 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා.

ග්‍රාම සංවර්ධන සමිති හෝ ගොවි සමිති හෝ මරණාධාර සමිතියක් හෝ කුමන හෝ සමිතියක් ගත්තත් ව්‍යාපෘති ලබා දෙන්නේ ලක්ෂ 20 කට බවත්, මුල් ලක්ෂ 20 අවසන් කරාට පසුව තමා තව ලක්ෂ 20 ක් දෙන්නේ. එකපාර කරන්න පුළුවන් ලක්ෂ 60 කට විතරක් බවත්, එම සීමාවෙන් එහාට කිරීමට නොහැකි බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් දැනුම් දුන් බවත්, ඒ නිසා තමාට ව්‍යාපෘති තුනකට වඩා සිදු කිරීමේ හැකියාවක් නොමැති බවත්, අවශ්‍ය නම් ටෙන්ඩර් මඟින් ලබා ගැනීමට හැකි බවත්, සභාවෙන් ටෙන්ඩර් දැම්මත් ඒ සඳහා කවුරුන් හෝ ඉදිරිපත් නොවුණහොත් එය ප්‍රශ්නයක් බවත්, ටෙන්ඩර් කැඳවා තිබුණද මේවන තෙක් කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා පෙ.ව 11.24 ට නැවත සභාවට පැමිණෙන ලදී.

කලින් පාර ව්‍යාපෘතියකට අත්සන් කළ නමුත් මිල වැඩිවීමත් සමඟ එම ව්‍යාපෘතිය සිදු නොකළ බවත්, ඒ අනුව ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය ආසාධු ලේඛනගත වී ඇති බවත්, ඒක ඉවත් කර දීමට හැකි නම් එය කර දෙන ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
ඒ සඳහා අභියාචනයක් සිදු කරන ලෙසට ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මෙතුමාගේ සමිති තුනක් පමණක් තිබෙන බවත්, ලක්ෂ 60 ට වඩා තව ව්‍යාපෘති තිබෙන බවත්, අනික් වසමේ සමිතියට ඒ සඳහා ඉදිරිපත් වීමේ හැකියාව මේ ගැසට් එක අනුව තිබෙන් බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
එසේ කිරීමට හැකි බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

සමිතියක මහජන නියෝජිතයෙක් හෝ නියෝජිතවරියක් ලේකම්, සභාපති වැනි ප්‍රධාන තනතුරු දරනව නම් ඒ සමිතිවලට මේ ව්‍යාපෘති සඳහා සම්බන්ධවීමට හැකිද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා පෙ.ව 11.25 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව ලේකම්තුමා මඟින් විස්තර දැන ගැනීම සඳහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් එම යෝජනාව මම ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.28 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා පෙ.ව 11.30 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.30 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා පෙ.ව 11.34 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා පෙ.ව 11.40 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.42 ට නැවත සභාවට පැමිණෙන ලදී.

05 (xii) යෝජනාවට අදාළව කරුණු සභා ලේකම්තුමා විසින් මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

, 05 (xii) යෝජනාව සම්බන්ධව විපක්ෂ කණ්ඩායම මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්, 2024 ගැසට් එක ප්‍රකාශ වුවාට පසු විපක්ෂයේ කාටවත් ව්‍යාපෘතියක් කිරීමට අවස්ථාවක් නොලැබුණු බවත්, මීන් පෙර සභාවට යොමු කළ ව්‍යාපෘති අනුමත වූ බවත්, ඒ සඳහා විරුද්ධ නොවුණු බවත්, හැබැයි මේ ගැසට් එක අනුව මීන් පසු කළ ව්‍යාපෘති කවුද කළේ මොනවද කළේ, මොන සමිතියද කළේ, කවුද කොන්ත්‍රාත් එක කළේ කියා අපිව ගාව ගන්න එපා.මේ සම්බන්ධව යම්කිසි පරීක්ෂණයක් සිදු වනවා නම්, විගණන විමසුම් අහනව නම් ඒ සම්බන්ධව ඔබතුමාලා විසින් වගකිව යුතු බවත්, මොකද මේ සම්බන්ධව සඳහන් කළේ, අද දිනත් මේ ගෙවීම් වාර්තාවේ සඳහන් මුදලක් සම්බන්ධයි.මේ ගැසට් එකට විරුද්ධව අද සමිතිවලට ගෙවීමට බිල් ඉදිරිපත් වී ඇති බවත්, අපි මේක අනුමත කරනවා කියන්නේ ඒ සඳහා බැඳෙන බවත්, විපක්ෂය සඳහා මුදලක් වෙන් කරන්නෙත් නෑ,ලක්ෂ 24 ක් දෙනවා කිවුවා ඒක දෙන්නෙත් නෑ.ඒ සම්බන්ධව කතා කරන්නෙත් නැතුව අපිව මේකට සම්බන්ධ කර ගන්න එපා කියන අදහස ඉදිපත් කිරීමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා.

එදා සාකච්ඡාව සඳහා තමාට සහභාගිවීමට නොහැකි වූ බවත්, අනෙක් මන්ත්‍රිවරු ඒ සඳහා නියෝජනය වූ බවත්, එදින සාකච්ඡාවේ දී විපක්ෂ මන්ත්‍රිවරු සඳහා ලක්ෂ 24 ක් ලබා දීමට තීරණය වූ බවත්, ඒ සඳහා අවධානය යොමු කරන ලෙසත්, මේ යෝජනා සඳහා අනුමැතිය දීමෙන් අපිද ඒ වරදට හසු වන බවත්, සභාව නොමග යයි කියා අනුමැතිය දුන්නත්, අපි මේවා දැන ගෙන සිදු කරන බවත්, අපි මේ මෝඩයෝ වගේ සහයෝගය දෙනවා නෙමේ.ඒ නිසා සභාපතිතුමාට ඒ ක්‍රමවේදය හරහා යම් යම් බාධා එන්න පුළුවන්. ඒ අයත් හදා ගෙන, ආණ්ඩු පක්ෂය විපක්ෂය කතාවක් නොමැති බවත්, සහයෝගයෙන් වැඩ කටයුතු සිදු වන බවත්, ඒ නිසා ඒ මුදල වෙන් කර දෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

දැන් සංවර්ධන යෝජනා ගන් නැත්තෙත් මෙතෙක් සභා සම්මත වූ යෝජනා විශාල ප්‍රමාණයක් පවතින බවත්, එම නිසා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එම යෝජනා සිදු කරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගමේ පවතින ග්‍රාම සංවර්ධන සමිතිය කැඳවා සක්‍රිය කරනව නම් වටින බවත්, ග්‍රාම සංවර්ධන සමිතියක් නැත්නම්, මිල ගණනත් කැඳවීමකින් එය ලබා දීමට හැකි බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

එය "එසේ වුවත් එවැනි ප්‍රජාපාදක සංවිධාන ඉදිරිපත් නොවන අවස්ථාවක දී ප්‍රාදේශීය ලේකම් හෝ වෙනත් බලධරයෙකු විසින් හැකියා සහතික නිකුත් කර ඇති ප්‍රජාපාදක සංවිධානයක් සඳහා අදාළ කමිටුවේ නිර්දේශ මත ගිවිසුම්ගත වීමට අනුමැතිය ලබා දීමට" යනුවෙන් යෝජනාවේ සඳහන් ඇති බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

මේ යෝජනාව යොමු කළේ කලින් කළ ව්‍යාපෘති සඳහා ආවරණයක් ගැනීමට බවත්, අමාත්‍යාංශයෙන්, පළාත් සභාවෙන්, සභාවෙන් වගේ විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් ලැබෙන බවත්, ඒ අනුව සෑම වසමකටම ව්‍යාපෘති තුනක් හතරක් අඛණ්ඩව යන බවත්, ඒ නිසා විධිමත් හා කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කිරීමට සිදු වන බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පසුගිය කාලේ ලක්ෂ 50 දක්වා තිබූ බවත්, දැන් එය ලක්ෂ 20 දක්වා අඩු වී ඇති බවත්, එය නැවත ලක්ෂ 50 දක්වා වැඩි කර දෙන ලෙසට සම්බන්ධීකරණ රැස්වීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා.

කලින් කරපු දේ සඳහාත් ආවරණ අනුමැතියක් ගන්න ඕන කියා ගරු උපසභාපතිතුමා ප්‍රකාශ කළ බවත්, ඒ අනුව පෙර වැරදි, ලොකු වැරදි නෙමේ, නමුත් මෙය එළියට ගොස් නීතිය බවට පත් වූ විට ලොකු වැරැද්දක් වන බවත්, ඒවටත් අපේ 16 දෙනා අනුමැතිය ලබා දී ඇති බවත්, ඒ සඳහාත් අපි සහයෝගය ලබා දෙන බවත්, විරුද්ධ වී නොමැති බවත්, ඒක ප්‍රශ්නයක් නැති බවත්, අපේ පැත්තෙන් වෙන දේට, ඕන දේක හිලවුවක් තියෙන නිසා ඒ හිලවුව ගැන තමා හැම වෙලේම කතා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.53 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා කළ ප්‍රශ්නය අනුව ලේකම්තුමා දුන් පිළිතුර වුයේ මහජන නියෝජිතයෙකු ඒ ගිවිසුමේ අත්සන් කර තිබෙනවා නම් ඒ ක වැරදියි කියන කාරණාව නේද? ඔබතුමා ප්‍රකාශ කළේ.2024 ගිවිසුමට ප්‍රකාරව යම්කිසි ගිවිසුමකට ඒ ග්‍රාමසේවා වසම තුළ අත්සන් කරන්නේ නම් ඒ අත්සන් කරන නිලධාරීන් අතර මහජන නියෝජිතයෙක් සිටිනව නම් ඒක වැරදියි කියන කාරණාව ලේකම්තුමා ප්‍රකාශ කළ බවත්, ඒ ගිවිසුම්ගත වන අවස්ථාවේ අත්සන් කළ නොහැකියි කියන කාරණාව පැහැදිලි කළා.ඒ නිසා ඒ 2024 ගැසට් එක තමාට ලබා දීමට කටයුතු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05.(xiii) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

2026 වර්ෂය සඳහා ඇහැලියගොඩ සති පොළ හා පදික බදු අය කිරීමට අදාළ ගිවිසුම උල්ලංඝනය කිරීම හා ඇහැලිගොඩ සති පොළෙහි පවතින මහජන වැසිකිළියේ ගාස්තු අය කිරීමේ ගිවිසුමෙන් බදුකරු වන කොක්ඕවිට, පරකඩුව ලිපිනයෙහි පදිංචි බී.ඊ.එස්.එස්.එස්. බුලද්ගම මයා ඉවත් වී ඇත.එබැවින් ඔහු සමඟ ඇති ගිවිසුම් අවලංගු කිරීම සඳහාත් ඒ සඳහා නැවත ලංසු කැඳවීමටත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙය කොන්ත්‍රාත්කරුවෙකුට භාර දුන් නමුත් එය නිසියාකාරයෙන් සිදු නොකළ බැවින් තුන්පාරක් විදුලිය කැපූ බවත්, පසුව ඔහු විසින් සභාවට දී තිබූ අත්තිකාරම් මුදලින් එය ගෙවීම් කර නැවත විදුලිය ලබා ගත් බවත්, නමුත් මෙය දිගටම සිදු කළ නොහැකි බැවින් එම ගිවිසුම අවලංගු කළ බවත්, මෙය නැවත කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දෙනවා නම් ලංසු කැඳවිය යුතු බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.

ආදායම් උත්පාදන මාර්ගයක් සැකසීම සඳහා පොළ භූමිය අනුමත වී ඇති බවත්, නිත්‍යානුකූල නම් මෙතෙක් කල් කළ පරිදි ටෙන්ඩර් නොදා සභාව විසින් ඊට අදාළ ගාස්තු අයකිරීම් සිදු කර, ලබන අවුරුද්දෙ ගෘහස්ථ ක්‍රීඩාංගනයත් සාදා ටෙන්ඩර් කිරීම සුදුසු බව ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා පෙ.ව 11.57 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගරු මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරුන්ට දැන ගැනීම සඳහා, පොළ භූමියේ විශාල භූමි ප්‍රමාණයක් තිබෙන බැවින්, පොළේ වෙළෙඳුන් කිප දෙනෙක් පමණක් සිටින බවත්, ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීමට පවා එයින් ලැබෙන මුදල් සමහර අවස්ථාවලදී ප්‍රමාණවත් නොවන බවත්, ඒ නිසා එම ශාලා දෙකෙන් එකක් ආදායම් උත්පාදන වැඩසටහනකට ගැනීමට කලින් සභාවක යෝජනා කළ බවත්, මේ 16 වෙනිදා පොළේ සිටින වෙළෙඳුන් රැස් කර සාකච්ඡාවක් කිරීමට යොදා ගෙන තිබෙන බවත්, එහි එක ශාලාවක ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සෑදීමට යෝජනාවක් කළ බවත්, එම යෝජනාව සඳහා මුදල් අනුමත වී ඇති බවත්, ඒ සඳහා අගෝස්තු 13 වන දා මුල්ගල තැබීමට දින නියම වී ඇති බවත්, දෙකොටි ගාණනක මුදල් ඒ සඳහා වැය වන බවත්, ඉන් කොටසක් සභා අරමුදලින් දැරීමටත්, ඉතිරි මුදල මධ්‍යම ආණ්ඩුවෙන් ලබා දෙන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා.

එක ගලින් කුරුල්ලෝ දෙන්නෙකුට ම ගැහුවා. ඒක හොඳයි.එහෙම තමා අත්දැකීම් බහුල වෙන කොට.එතන කාරණා දෙකක් බවත්, එකක් පොළේ බදු සම්බන්ධ කාරණාව බවත්,අනික ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල සම්බන්ධව.මෙය කාරණා දෙකක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සරෝජනී ජීනේන්ද්‍රානි මැතිනිය ප.ව 12.01 ට සභා ගර්භයෙන් පිට විය.

අතීතයේ පොළක් වගේ දේකදී විදුලිය සඳහා බිල ගෙවා, ටෙන්ඩර්කරුගෙන් මුදල අය කර ගත්තේ ඒ සියල්ල ආවරණය වන පරිදි බවත්, එය වෙනස් කළේ මොන පදනමකින්ද යන්න තමන් දැන ගැනීමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ටෙන්ඩරය ලබා දී ඇත්තේ බදුකරු විසින් විදුලි බල ගෙවිය යුතු යන එකඟතාවය මත බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා.

ඇහැලියගොඩ පොළ කියන්නේ පොළේ අඩුපාඩු තිබ්බත් ඒවා වෙනත් කාරණා බවත්, මේ ප්‍රදේශයේ ලොකු නියෝජනයක් වන තැනක් බවත්, ඒවගේ තැනක බදුකරුට විදුලිය සැපයීමට භාර දීමෙන්, පොළේ නමත් කැත වූ බවත්, අපි විපක්ෂයක් විදිහට ලොකු කැප කිරීමක් කළ බවත්, අපි කවුරුවත් මාධ්‍යට නොගිය බවත්, ලකුණු දාගන්න කියන කතා නොවන බවත්, අපි උඩබලන් කෙළ ගහන්න කැමති නැති බවත්, අපි එහෙම දේශපානයක් කර නැති බවත්, නමුත් පොළේ ඉන්න සමහරු දීපු වොයිස් කට්වලින් සභාපතිතුමාට විතරක් නෙමේ හානි වුණේ.ඒක අපිටත් හානි වූ බවත්, මේ සමස්ත සභාවට ම හානියක් වූ බවත්, නමුත් මෙහෙම හානි වෙන්න දෙන්න බැරි බවත්, මේ නිසා ඉදිරියේ දී මෙවැනි දේ නොවිය යුතු බවත්, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා කියන පරිදි මාස දෙක තුනකට ටෙන්ඩර් දාන්න ගිහින් අපහසුතාවකට පත් වීමට අවශ්‍ය නැති බවත්, 2024 ක්‍රමය අනුගමනය කිරීම ගැටලුවක් නැති බවත්, මේ කෙටි කාලයක් තුළ ඊළඟ ටෙන්ඩර් කැඳවීමේ දී වෙනස් කළ යුතු කොන්දේසි මෙනවාද යන්න ප්‍රකාශ කිරීමේදී ඒ වගකීම බදුකරුට ලබා නොදිය යුතු බවත්, එය තමන්ගේ අදහසක් බවත්, අනෙක් මන්ත්‍රිවරුන්ගේ මතය තමන් නොදන්නා බවත්, සභාවෙන් පොළ කරනවා නම් එය ප්‍රශ්නයක් නැති බවත්, ටෙන්ඩර් කැඳවා ඒ ක්‍රියාදාමය හරා ගොස් සිදු කරනවා නම්, එය වෙනත් පාර්ශවයක් වන නිසා , ඒ පාර්ශවයට විදුලිය සැපයීම සම්බන්ධ කාරණාව ලබා නොදිය යුතු බවත්, ඒ විදුලිය සඳහා යන මුදලද එකත් කර ටෙන්ඩරයටම ඒ අවශ්‍ය ප්‍රතිපාදන එකතු කළ යුතු බවත්, (වතුර බිල, ශ්‍රමයට කුලිය,) තමන් අදහසක් ලෙස මෙය ප්‍රකාශ කළ බවත්, සභාපතිතුමාට අවශ්‍ය විදිහට බලය පාවිච්චි කර එය කිරීමට අවස්ථාව තිබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.02 ට සභා ගර්භයෙන් පිට විය.

ගෘහස්ථ ක්‍රීඩාංගනය සම්බන්ධ කාරණාව ගැන කතා කිරීමේ දී, එය හොඳ යෝජනාවක් බවත්, ඒ සඳහා එකඟතාවයද පළ කළ බවත්, ඒ සඳහා සුභපතන බවත්, දෙවර්ෂ පූර්ණය සිහිකිරීම ඉලක්ක කර එය කරන්නට සැලසුම් කරන්නට ඇති බවත්, කිසිම විරෝධතාවක් නොමැතිව ඒ සඳහා ආශිර්වාද කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

පොළ කියන්නේ සභාවේ ආයතනයක් බවත්, එහි විදුලිය කප්පාදු වීම සම්බන්ධව ගැටලුවක් පවතින බවත්, තමන් එතන කුමක්ද වුණේ යන්න බලන්න ගියවිට ගරු සභාපතිතුමා සමඟ දුරකතනයෙන් සාකච්ඡා කර ඔබතුමාගේ අදහස තමන් විමසූ බවත්, සභාවේ ආයතනයක් විදිහට විදුලිය විසන්ධි කිරීම කිසිසේත් අනුමත කළ නොහැකි බවත්, විදුලිය විසන්ධිවීම අවස්ථා තුනකදී සිදු වී ඇති බවත්, තුන්වැනි අවස්ථාවේදී පොළේ අයට පාඩමක් උගන්වන්න විදුලිය ලබා නොදී සිටිය බවත්, පාඩමක් ඉගැන්වීම තුළ අපේක්ෂා කළ දේ සිද්ධ වෙලා තිබේද? යන්න තමාගේ ප්‍රශ්නය බවත්, එසේ පාඩමක් සිදු වී නොමැති බවත්, තමන් මේ ප්‍රශ්නය වෙනත් තැන්වල කතා නොකළ බවත්, මෙය විසඳ ගැනීමට අද වන තුරු සිටි බවත්, ගරු සභාපතිතුමා අපේක්ෂා කළේ ඒ අවස්ථාවේ, බදුකරුට පොළ කරන අයගේ නියමිත බදුගාස්තු ගෙවා ගැනීමට සඳහා පොළේ ඉන්න අයට බලපෑම් කිරීම සඳහා දවස් තුනක විදුලිය කප්පාදුවක් දීරඝ කළ බවත්, ඒතුළින් ඔවුන් බදු ගෙවීම සිදු කළා ද යන්න නැවතත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රශ්න කරන ලදී. නමුත් ඔවුන් බදු මුදල් ගෙවා නැති බවත්, නමුත් අපේක්ෂා කළ දේ සිදු නොවූ බවත්, ඒ තළින් දැඩි හානියට පත් වී ඇත්තේ සභාව. සභාවේ ආයතනයක විදුලි කප්පාදුවක් වුණා අවස්ථා තුනක දී.මෙය පරිපාලනමය ලොකු දෝශයක් බවත්,එසේ ආයතනයක විදුලි කප්පාදුවක් වීමට ඉඩ නොදිය යුතු බවත්, පොළ බදුකරු සමඟ වූ ගිවිසුමේ, මෙවැනි සිද්ධියක් වූ විට අපි ගන්නා වූ ක්‍රියාමාර්ග ඔවුන් සමඟ එකඟ වී තියේ ද යන්න කියන කාරණාව තමන් දැන ගැනීමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චිත්‍රමසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 12.07 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 12.07 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඇහැලියගොඩ පොළ භූමියේ විදුලිය යොදා ඇති ආකාරය කිසිම පිළිවෙළක් නොමැති බවත්, සමහර වෙළෙදුන් විදුලි බල්බ 10 – 15 යොදා ඇති බවත්, සමහරු කැමරා පවා සවි කර ඇති බවත්, විදුලිය පිරිමසා ගැනීමට කටයුතු කරයි කියන පදනමින් බදුකරු සමඟ ගිවිසුම්ගත වූ බවත්, එයාලට නඩු දමන්න බැරි බවත්, විදුලි බිල හා ජල බිල ගෙවනවා කියා ඔහු අත්සන් කර ඇති බවත්, නීතිමය වශයෙන් පොඩි ගැටලුවක්වත් එ.න සිදු නොවන බවත්, එතන වැරද්දක් වුණානම් සිදුවූයේ දෙවැනි දවසෙ විදුලිය කපපු එක පමණක් බවත්, සුමානෙකට දවස් දෙකක් වෙළෙන්දන් එන බවට නීතිය තිබෙන බවත්, උදේ ඉඳන් රෑ එළිවෙනකන් ඉන්න දෙන්න ඕන කියන එකක් නැති බවත්, මුළු සතියේම විදුලිය ලබා දෙන්න කියා නැති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා ප.ව 12.09 ට සභා ගර්භයෙන් පිට විය.

මේ සිදුවීම මාධ්‍ය තුළ දානවට කැමැත්තෙන් සිටි බවත්, අපිට උත්තර දෙන්න තමන්ට උත්තර තිබුණ බවත්, නමුත් මාධ්‍ය නොදැමු බවත්, එතන ඒකාධිකාරියක් යන බවත්, (සෝෂාව) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 12.11 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ආදායම් උත්පාදනය සඳහා එක් ගොඩනැගිල්ලක් ලබා ගන්නා බවත්, සභාවට මුදල් එන්න, සේවක පඩි ගෙවන්න, වෙනත් වියදම් දරන්න, මුදල් අවශ්‍ය බවත්, සමහර ප්‍රාදේශිය සභාවල ගමන් වියදම් පාවා නොදෙන බවත්, අපේ සභාවේ එහෙම නැති බවත්, දැන් එයාල දන්නවා එයාල ගෙවපු නැති නිසා තමා විදුලිය කැපුවේ කියා.මේ අතර වෙළෙන්දන් කීපදෙනෙක් ඉතාම හොඳ බවත්, තොග එන අය අතර හරියට මුදල් ගෙවන අය සිටින බවත්, ඒ පිරිස නැති කරගෙන බැරි බවත්, පොරොන්දු වෙලා තියෙන දවස් දෙකේ විදුලිය ලබා දී ඇති බවත්, ඉතුරු දවස් තුන විදුලිය කැපු බවත්, සතිය පුරාම දෙන්න නීතියකුත් නැති බවත්, දවස් 7 ම සිටියට සමහරු ගෙවීම් සිදු නොකරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා ප.ව 12.12 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

සභාපතිතුමා ප්‍රකාශ කරන දේ ඉතා පැහැදිලි බවත්, අපේ ආයතනයක විදුලිය කප්පාදු කිරීම අනුමත කරකවා ද යන්න තමන්ට තිබෙන ප්‍රශ්නය බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් නැවතත් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
අනුමත කරන් නෑ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
අනුමත කරන් නැත්නම් ඒ දේ කරලා තියෙනවානේ.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා
අපි නෙමේනේ කළේ විදුලිබල මණ්ඩලයනේ.(සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
විදුලිබිල හා ජල බිල ගෙවීමට ඊළඟ ගිවිසුමට ඇතුළත් කිරීමට හැකිද යන්න සලකා බලන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා
කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් ගිවිසුම ගහද්දි විදුලිබිල හා ජල බිල ගෙවීමට ලිඛිතව එකඟ වී ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ඔබතුමා, ලේකම්තුමා ඇතුළු නිලධාරීන්, පොළේ මොකක්ද කරන්නේ කියා අධික්ෂණයක් කරන් නැද්ද යන්නත් මේ බිල් ගෙවීම් කළා ද යන්න අධික්ෂණයක් කරන් නැද්ද යන්නත්, එසේ සොයා බැලුව නම් මෙලෙස විදුලි කප්පාදුවක් වෙන්න විදිහක් නැති බවත්, (සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් නැවතත් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා
අසාධු ලේඛනගත කළේ ම විදුලිය කැපීම. ම බවත්, විදුලිය කැපීම ප්‍රමුඛත්වය ගත් බවත්,ඒනිසා විදුලිය කපන්න අවශ්‍ය බවත්.කපන් නැතුව හිටියොත්, නෑ අපි ඕක ගෙවන්න හිටියෙ කියලා ප්‍රකාශ කරනකවා පමණක් බවත්,

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
සභාපතිතුමා ම පිළිගන්නවා සභාපතිතුමා හා ඔක්කොම එකතුවෙලා පොළේ විදුලිය කැපුව කියලා.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා
නෑ.නෑ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
සභාපතිතුමා දැනුවත්වනේ විදුලිය කැපුවේ.දැන් කිවුවේ ගිවිසුම අවලංගු කරන්න ඒක හේතුවක් කියලා.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා
විදුලිය කැපීම, ගිවිසුම අවලංගු කිරීමට ඒක හේතුවක් වුණා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ඒ කියන්නේ සභාපතිතුමයි ලේකම්තුමයි කැමැත්තෙන් ඉදලා තියෙන්නේ විදුලිය කැපුවට.එහෙම කැමැත්තෙන් හිටියෙ නැත්නම් ඇයි මේක පරීක්ෂා කළේ නැත්තේ, විදුලි බිල අදාළ මාසෙට අදාළව ගෙවීම් කරනවද කියලා.(ඝෝෂාව)

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

විදුලිබල මණ්ඩලය අපිට කිය කියා විදුලිය කපන් නෑ.දැන් කොම්පැනි 6 කට බෙදා ඇති බවත්, දැන් පොඩි ගාණක් ඇරියස් වුණ ගමන් විදුලි කප්පාදුව සිදු කරන බවත්, සභාපති නෙමේ ඇමතිලාටවත් කියන් නැති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මේ සභා පරිශ්‍රයේ විදුලිය විසන්ධි වීමක් වෙන්න පුළුවන්ද? ඇයි පොළේ ගෙවුවෙ නැත්තේ.ඇයි අපේ සභාවේ ප්‍රධාන කාර්යක් පොළ බදුකරුට දුන්නේ?

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සභා පරිශ්‍රය බදු දී නොමැති බවත්, මේක අපේ නිරීක්ෂණයෙන් යන බවත්, පොළ බදු දී ඇති බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ඊළඟට ගිවිසුම්ගත වීමේදී විදුලිය සම්බන්ධ වගකීම සභාව භාරයේ තබා ගෙන, ඒ ගිවිසුමට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

හරියට නිරීක්ෂණය කරලා,හරියට වැයරින් ටික කරලා, ජල පද්ධතිය හදලා.දැනටමත් ටැප් 05 ක් කැඩී ඇති බවත්, සමහරක් නැමටත් ගන්නා බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා. විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.
විදුලිය විසන්ධිවීම හා ඒ සඳහා වැඩිපුර ගෙවූ මුදල සම්බන්ධ වගකීම සභාපතිතුමා ගත යුතු බවත්,

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
සභාවට කිසිම පාඩුවක් නැහැ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

තමන් ආයතනයෙන් විමසූ විට, ඒ තැන්පත් මුදලින් විදුලිබිල ගෙවිය නොහැකි බව ප්‍රකාශ කළ බවත්, විෂය නිලධාරිගෙන් තමන් විමසූ බවත්, තැන්පත් මුදලින් ගෙවීමට ගිවිසුමේ බලයක් නැතිබව ප්‍රකාශ කළ බවත්, ප්‍රකාශ කළේ ඒ පරිද්දෙන් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

දැන් තැන්පත් මුදලින් ගෙවා ගන්න පුළුවන්. එවිට තැන්පත් මුදල අඩු වන නිසා, මේ දේ දිගටම කරන්න බැරි බවත්, නිශ්චිත ගාණක් තැන්පත් විදිහට තියා ගත යුතු බවත්, ඊළඟටත් නැවත කැපුවොත් ප්‍රශ්නයක් වන නිසා, මේ ගිවිසුම නතර කිරීමට කටයුතු කිරීම සුදුසු ලෙස ප්‍රකාශ කරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා. විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

පරිපාලනය කරන ආයතනයක් විදිහට විදුලිය කැපීම සම්බන්ධ වගකීම, එයින් සිදු වූ හානිය සභාවක් විදිහට අපි භාර ගත යුතු බවත්, හිතුණ හිතුණ කෙනාට මෙහි වගකීම නොදිය යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
මන්ත්‍රීතුමා, අපි කොන්ත්‍රාත්කරුට භාර දෙන විට මුලු සභාවම ඒකමතිකව ඒක භාර දුන්නනේ.ඒක පිළි ගන්නවනේ.ඉතින් එතුමා (සෝෂාව)

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

අපේ ආයතනයක විදුලිය කප්පාදු වීම ගැන ලොකු අප්‍රසාදයක් පවතින බවත්, එහෙම වෙන්න දෙන්න එපා කියලා තමන් ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
මේක කැමැත්තෙන් වුණා නෙමෙයි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

මේ බදු ගිවිසුම අවලංගු කරනවනේ.බදුකරුගෙන් අයවිය යුතු මුදල් මේවන විට අයවී තිබේද යන්නත්, තමාට මතක හැටියට අවුරුද්දට ලක්ෂ 18 වගේ බදු දුන් බවත්, මාසෙකට ලක්ෂ එකහමාර බැගින් ගෙවීම් සිදු කරන බවත්, බදුකරුගේ මේවන විට හිඟ මුදලක් තිබේද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ප.ව 12.14 ට නැවත සභාවට පැමිණෙන ලදී.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා ප.ව 12.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මන්ත්‍රීතුමා එකතුව ගත්ත විට භාරලක්ෂ අනු හයදහස් පන්සිය හතළිස් අටයි ශත අනු අටක මුදලක් අපට ගන්න ඕන බවත්, එය ඇප වශයෙන් සභාව සතුව තිබෙන බවත්, වැසිකිළිය හා පොළ යන දෙකම ඔහු විසින් බදු ගෙන ඇති බවත් දෙකකට වෙන වෙනම ඇප මුදල් තිබෙන බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා. විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ සම්බන්ධව විෂය නිලධාරී මඟින් විස්තර දැන ගැනීම සඳහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් එම යෝජනාව මම ස්ථිර කරන ලදී.

05 (xiii) යෝජනාවට අදාළව කරුණු සහා ලේකම්තුමා විසින් මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නට විය.

ගරු උප සභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසුරිය මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා හා ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා ප.ව 12.15 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා ප.ව 12.16 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය .ව 12.17 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය ප.ව 12.20 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 12.21 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප.ව 12.22 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 12.24 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා ප.ව 12.26 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සියලුම මන්ත්‍රිවරුන්ගේ දැන ගැනීම සඳහා ඊළඟ සභාවාරයේ මේ සම්බන්ධ සාරාංශ වාර්තාවක ලබා දීමට විෂය නිලධාරීතුමිය පොරොන්දු වූ බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා. විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

05.(xiv) ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

පහත සඳහන් මාසවල දෛනික සේවකයින්ගේ හා නිලධාරීන්ගේ වැටුප් ලෙස ගෙවා ඇති ගෙවීම් වවුචර් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ස්ථිර සේවක - අප්‍රේල් මාසය - රුපියල් 5,791,736.05
- මැයි මාසය - රුපියල් 5,801,912.73
- ජුනි මාසය - රුපියල් 5,661,683.94

දෛනික සේවක - මාර්තු මාසය - රුපියල් 1,384,119.00
- අප්‍රේල් මාසය - රුපියල් 1,252,303.02
- මැයි මාසය - රුපියල් 1,384,373.02

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව සභාවේ බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා ප.ව 12.40 ට නැවත සභාවට පැමිණෙන ලදී.

❖ **කල් දි නොමැති යෝජනා**

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

කල් දි නොමැති යෝජනාවක් ලැබී ඇති බවත්, එම යෝජනාව අදාළ මන්ත්‍රීවරයා හෝ මන්ත්‍රීවරිය විසින් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා **විසින් ප්‍රකාශ කරන ලදි.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ඒකාබද්ධ විපක්ෂය ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව ඇහැලියගොඩ.202607.13. ගරු සභාපතිතුමා, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව ඇහැලියගොඩ. අනිවසර ඉදිකිරීමක් සම්බන්ධයි. ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ බුළුගහපිටිය දන්කුඹුර ලිපිනයේ පදිංචි ජී.එච්.එන්.අජන්ත විජයසිංහ යන අය ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ මහජන නියෝජිතයෙක් ලෙස තේරී පත් වී ඇති ඔහු ඔහුගේ නිවස ඉදිරිපස බුළුගහපිටිය දන්කුඹුර මාර්ගයේ පැතිබැම්ම සමඟ තාප්පයක් ඉදිකිරීමට කටයුතු කරමින් සිට ඇත.ඒ අතර 2026 ජූලි 12 දින ප.ව 3.45 ට පමණ පොලිස් හදිසි ඇමතුම් ඒකකයට ප්‍රදේශවාසීන් විසින් සිදු කරන ලද දැනුම් දීමකට අනුව පොලිස් නිලධාරීන් පැමිණ අනවසර ඉදිකිරීම තාවකාලිකව නැවැත්වීමට කටයුතු කර ඇත. 1987 අංක 15 දරන පනතේ විධිවිධාන අනුව ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගයක මධ්‍ය ලක්ෂයේ සිට අඩි 25 ක් ඇතුළත ඉදි කිරීමක් සිදු කිරීමට හැකියාවක් නොමැත.එසේ කළ හැක්කේ අදාළ පළාත් පාලන අයතනයේ, ප්‍රාදේශිය සභාවේ නිර්දේශය මතය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා ප.ව 12.45 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 12.46 ට සභා ගර්භයෙන් පිට විය.

01.මෙම ඉදි කිරීම සඳහා අවසරය නිර්දේශය පළාත් පාලන ආයතනයෙන් ලබා ගෙන තිබේද?
02.මෙම ඉදිකිරීම් අඩි 25 ක් ඇතුළත සිදු කිරීම, ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙකු විසින් සිදු කිරීම නීතියානුකූලභාවය පිළිබඳව ගැටලුවක් පවතී.
03.මෙම ඉදිකිරීම සම්බන්ධව ප්‍රාදේශිය සභාව දැනුවත්ව සිටියේද?
04.ඉහත කාරණය පිළිබඳව ප්‍රදේශවාසීන් අතර නොසන්සුන්තාවක් ඇති බැවින් මේ පිලිබඳව ප්‍රාදේශිය සභාව ලෙස ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද?
මේ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන් අත්සන් තබා ඇති බවත්, මෙහි පිටපත් පළාත් පාලන කොමසාරිස්, පළාත් ලේකම්තුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, ආණඩුකාරතුමිය, පළාත් පාලන හා පලාත් සභා විෂයභාර ඇමති, අගමැති, ජනාධිපතිතුමා වෙත යොමු කර ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේක කල්දී ඇති ප්‍රශ්න ලෙස ඉදිරිපත් කළා නම් සුදුසු බවත්, මෙය යෝජනාවක් නොව මෙහි ප්‍රශ්න කිහිපයක් අසා ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

මෙය උදේ සභාවට ඉදිරිපත් කළ බවත්, සභාපතිතුමා ම විසින් එය සවස ඉදිරිපත් කරන බව පවසූ බවත්, ඒ නිසා මෙය මේ අවස්තාවේ සාකච්ඡා කිරීමට සිදු වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙම ලිපිය දුන් අවස්ථාවේ තමා එය නොබැලූ බවත්, බැලීමට වෙලාවක් නොතිබූ බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

මගේ නම සඳහන් වූ නිසා, මේ සම්බන්ධව කතා කිරීමට තමාට අවසර ලබා දෙන්නේ ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා විසින් විමසන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

සමාවෙන්න මන්ත්‍රීතුමා, මෙය යෝජනාවක් නෙමේ ප්‍රශ්න ටිකක් බවත්,මෙය කතා කිරීම ගැටලුවක් බවත්, මෙය යෝජනාවක් ආකාරයෙන් ඉදිරිපත් වුවහොත් සාකච්ඡා කළ හැකි බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

නිශ්චිත ඉදිකිරීම් සිදු කරන විට මේ විදිහට ඉදි කරන්න අයිතිවාසිකමක් තිබෙනවා ද යන්නත්, මෙලෙස පැමිණිල්ලක් සභාවට ආවහම මේව නවත්වන්නත් පුලුවන්ද? යන්නත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මෙය සභාවෙන් ම කළ යුතු වැඩක් බවත්, මෙය මහා සභාවට යොමු කිරීම අවශ්‍ය නොමැති බවත්, සභාවට මේය දැන්වුවා නම් ප්‍රමාණවත් බවත්, එවිට සභාවේ කාර්මික නිලධාරී හ් අවස්තාවේ ම ස්ථානීය පරීක්ෂණ සඳහා යොමු කරන බවත්, එසේ සිදු කිරීමට තිබූ කාරණාවක් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

මේ සම්බන්ධව තමාටද දුරකතන ඇමතුම් විශාල ප්‍රමාණයක් ලැබුනු බවත්, ගරු සුජීව මන්ත්‍රීතුමා හරි ගරු සුමිත් මන්ත්‍රීතුමාට හරි දැනුවත් කරන ලෙසට තමා ප්‍රකාශ කළ බවත්, ඕක කරන්නේ ආණ්ඩු පක්ෂය අයත් හවුලේ තමා කරනවා ඇත්තේ කියා තමා එසේ ප්‍රකාශ කළ බවත්, නැත්නම් මේක සභාවට පුර්වාදර්ශයක් වන බවත්,(සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ජෝකර් කෙනෙක් නෙමෙයි.ප්‍රදේශයේ ප්‍රදේශවාසින්ගේ ප්‍රශ්නයක් කතා කිරීමේ අයිතියක් මේ සභාවේ තිබිය යුතු බවත්, (සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

1987 අංක 15 දරන පනතේ මෙය නීත්‍යානුකූලව තිබෙන බවත්, ලේකම්තුමා පොඩ්ඩක් සද්ද නැතුව ඉන්න.එදා ඉරිද දවසක් බවත්, ඉරිදා දවසේ කොහොමද සභාවට කෝල් කරන්නේ.(සෝෂාව) පනතේ 59 යේ 1,2,3,4 – 60 1,2 පනතේ තිබෙන බවත්,සබාවට කියන් නැතුව වෙන කොහෙටද කියන්න කියන්නේ,(සෝෂාව) පලාත් පාලන නියෝජිතයෝ ඉන්නව නම් එදා දවස ප්‍රාදේශිය සභාව වහල නම්(සෝෂාව) සබාවට දාන්න එපා නම් කාගෙ බලෙන්ද මේවා කරන්නේ.කවුද මේ රාජකාරිය කරන්නේ.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

රාජකාරිය කරන්න විදිහක් තියෙනවා මන්ත්‍රීතුමා.(සෝෂාව) මේක නිති විරෝදි නම් නීතිය ක්‍රියාත්මක කරන්න ඕන බවත්, මෙය සභාවට ඉදිරිපත් කළ ක්‍රමයේ වැරැද්දක් ලෙසයි තමන් ප්‍රකාශ කළේ බවත්, (සෝෂාව) උදේ පාන්දර මේ ප්‍රාදේශිය සබාවට ඇවිත් මොකක්ද මේ කතා කරන්නේ, සභාවට දුන්න නම් කාර්මික නිලධාරී ඉන්නවා.එහෙනම් මේ වන කොට නතර කරලා ඉවර බවත්, මේ පැය ගාණක් තිස්සේ මේ කතා කරන්නේ ඕන එකක් ද? යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රශ්න කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ඔබතුමාලට මේ දේශපාලන වාසි ගන්න එහෙම කතා කරන්න එපා යනුවෙන් (සෝෂාව) ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා ප්‍රකාශ කළේය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

කාර්මික නිලධාරී මහතාව උදේ දැනුවත් කළා නම් කාර්මික නිලධාරී මහතා උදේ ගිහින් එය නවත්වන බවත්, එක්කෙනෙක්ගෙ පැත්තක් තමන්ට ගැනීමට නොහැකි බවත්, මේ ලිපිය ගමන් නොබැලූ බවත්, පැත්තක් ගැනීමට තමන්ට කිසිම අවමනාවක් නොමැති බවත්, මේ සම්බන්ධව තමාව දැනුවත් කළා නම් ඒ අවස්වේ ම තමා විසින් කාර්මික නිලධාරීතුමාව ඒ සඳහා යොමු කරන බවත්, එවැනි දේවල් දුරකතන මාර්ගයෙන් හෝ තමාව දැනුවත් කරන ලෙසත්. එසේ වුවහොත් තමන් ඒ සඳහා ක්‍රියාත්මක වෙන බවත්, මෙවැනි දේවල් තමන් විසින් කොච්චර නවතා තිබේද යන්න අසා බලන ලෙසත්, කාර්මික නිලධාරී ඉන්නේ ඒ සඳහා බවත්, කාර්මික නිලධාරී ඒ සඳහා යොමු වුයේ නැත්නම් එහි චෝදනාව කෙළින් ම තමට සිදු කරන ලෙසත්, කොයි පක්ෂයේ වුණත් වැරදි නම් වැරදි තමා බවත්, වැරදි ඉදිකිරිමක් නම් අපි එය නවත්වන බවත්, හේ 16 අත්සන් කරන්න ඕනෙත් නෑ..ඕක නවත්වන්න ලිපිය එක්කෙනෙක් දෙන ලෙසත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

(උ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

i. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තා -ඇමුණුම් ලේඛනය i / ii / iii

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

2026.06.08 දින 6 වැනි පිටුවේ 6 යටතේ “2026.06.19 දින කසල අංගනයට අයත් අක්කර 6 ප්‍රමාණයක ඉඩම මැනීම සඳහා එච්.කේ.වී.පී සෝමතිලක කියන මිනින්දෝරු මහතාට දින ලබා දී ඇති අතර, එම දිනයෙදී ඉඩම මැනීමට අනුමැතිය ලබා ගැනීම හා ඉඩම මැන පිඹුරුපත් සකසා දීමෙන් පසු ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ කාරණාවට අනුමැතිය ලබා දීමට තිරණය කරන ලදී.” තමන් දන්නා විධියට නියමිත ප්‍රසම්පාදන ක්‍රමයට ලබා දී ඇති බවත්, මේ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබී ඇති බවත්, මේ අක්කර 6 මැනිම් කටයුතු සිදු කළාද යන්න දැන ගැනීමට කැමති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 12.49 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මැනීම් කටයුතු සිදු කිරීමට අවසර ඉල්ලා බ්‍රවුන්ස් සමාගමට ලිපි යොමු කර ඇති බවත්, එම ආයතනයෙන් ප්‍රවේශ වීම තහනම් කර ප්‍රකාශ කරමින් ලිපියක් ලැබී ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජීර සුසන්ත ජයසෝම මැතිතුමා ප.ව 12.51 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

මැනිම් කටයුතු සිදු කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇත්තේ බ්‍රවුන්ස් ආයතනයෙන් අනුමැතියකින් තොරවද යන්න ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

මේ සම්බන්ධව කරණු ඉදිරිපත් කිරීම සඳහා සාමාන්‍ය සභා රැස්වීම කාරක සභාවක් බවට පත් කරන ලෙස ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් සභාව කාරක සභාවක් කිරීමට යෝජනා කළ අතර, ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා ප.ව 12.54 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප.ව 12.54 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා ප.ව 01.02 ට නැවත සභාවට පැමිණෙන ලදී.

සභා ලේකම්තුමා විසින් 2026.06.08 මුදල් කාරක සභා වාර්තාවේ අංක 06 කාරණයට අදාළව කරුණු පැහැදිලි කරන ලදී.

ගරු උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් කිරීමට යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා විසින් ඒම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

කසල ගෙනි යන කොට බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ සුසාන භූමිය ඉදිරිපිට ඇති මාර්ගයේ කසල දාගෙන ගිහින් තිබෙන නිසා ඒ මාර්ගයේ ගමන් කරන්නවත් බැරි බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත්,පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ii. නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය iv
iii. කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය v
iv. මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව -ඇමුණුම් ලේඛනය vi / vii /viii

(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

i. 2026 ජුනි මස ආදායම් වියදම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය ix
ii. 2026 ජුනි මස හිඟ ආදායම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය x
iii. 2026 ජුනි මස ගෙවීම් වාර්තාව. - ඇමුණුම් ලේඛනය xi
iv. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගනන මතය ඉදිරිපත් කිරීම - ඇමුණුම් ලේඛනය xii

(ඒ) සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

පෝලිසිය අසල ගංවතුරින් යටවීම සම්බන්ධව ඉතා කඩිනමින් කටයුතු කරන ලෙසට ලේකම්තුමා විසින් ලිපියක් යොමු කර තිබෙන බවත්, ඒ සඳහා පළමු ස්තූතිවන්ත වන බවත්, සැම දාම වැහි කාලෙට පොලිසිය ළඟ යට වන බවත්, එය කඩිනමින් කළ යුතු බවත්, එය ඉක්මනින් සිදු වෙයි කියා විශ්වාසයක් තිබෙන බවත්, මාහිංගොඩ නාකන්දල සම්බන්ධීකරණයේදී කතා වුණ බවත්, එය ඉතා කඩිනමින් සිදු කරයි කියා විශ්වාසයක් තිබෙන බවත්, ඊට අමතරව ජානිස් මාවත පුලුල් කරන්නත් කතා කළ බවත්, ඒ සම්බන්ධව තමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා අවස්ථා ගණනාවකදී ම කතා කළ බවත්, එම මාර්ගයේ ත්‍රිවිල් දෙකකට මාරු වීමටවත් නොහැකි බවත්, එයද ඉතා කඩිනමින් කරයි කියා විශ්වාස කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සිර් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ප.ව 01.05 ට සභා ගර්භයෙන් පිට විය.

යායපාර මහේෂ් මහතාගේ නිවස අසල මීටර් 50 ක පමණ ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට ඉල්ලීම් කළ බවත්, නමුත් මීටර් 50 කටත් අඩු ප්‍රමාණයකට කොන්ක්‍රීට් එක වැටෙන බවත්, ඒ ටික විතරක් දැම්මහම එතනින් එහාට තනිකර මඩ වගුරක් බවත්, ගමේ මහජනතාවගෙනුත් දැඩි විරෝධයක් තිබෙන බවත්, දෙපැත්තෙම තාප්ප නිසා වතුර බැස්ස වීමට නොහැකි බවත්, ඉතිරිවන මීටර් 10 ක පමණ කොටස ද කොන්ක්‍රීට් කර දීමට හැකිනම් සභාවටද ගෞරවයක් ඇති වන බවත් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ අවදානය යොමු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා ප.ව 01.07 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ලොකු ප්‍රමාණයක් නැති නිසා එම මීටර් 10 පමණ වන කොටසද කොන්ක්‍රීට් කිරීමට කටයුතු කරමු යැයි ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ප.ව 01.08 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

නගර සංවර්ධනය සඳහා ලොකු මුදලක් වෙන් වූ බව සම්බන්ධීකරණයේදී කතා වූ බවත්, මේ අවුරුද්ද අවසන් වීමට ඇත්තේ තව මාස 5 ක් පමණක් බවත්, මේ වැඩසටහන් මේ අවුරුද්දේ සිදු කිරීමට නොහැකි වුවහොත් මෙම ප්‍රතිපාදන අහිමි වන බවත්, මේ සභාවටවත්, මේ නගරයටවත්, මහජනතාවටවත් වරප්‍රසාදයක් ගැනීමට නොහැකි වන බවත්, ඒ නිසා ඔබතුමා හා සම්බන්ධීකරණයේ සභාපතිතුමන් මැදිහත් වී මෝරගල සිට මාහර හන්දිය දක්වා ඉතා කඩිනමින් මාර්ගය මංතීතු 4 ට පුළුල් කිරීමේ වැඩසටහන ඉතා කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන ලෙසත්, නැතහොත් මේ මුදල් වලින් වරප්‍රසාදයක් කිසිම කෙනෙකුට නොලැබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා ප.ව 01.09 ට සභා ගර්භයෙන් පිට විය.

යකුදාගොඩ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමාගේ නිවෙස ළඟ පළවෙනි පටු මග මාස දෙකක් හෝ තුනක් ඇතුළත ලයිට් දමා ඇති බවත්, මාස 2 ක් ඇතුළත පළමු කණුවේ හෝ දෙවැනි කණුවේ එම ලයිට් පිච්චි ඇති බවත්, ඒ සඳහා අලුතින් ලයිට් එකක් සවි කරන ලෙසට ඉල්ලීමක් කරන බවත්, ලයිට් ගෙනත් මාස 2 න් ලයිට් ටික පිච්චෙනව නම් ඒ ලයිට් සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට ඉල්ලිමක් කරන බවත්, මහජනතාවගේත් බදු මුදල් නිසා නිසි ක්‍රියාමාර්ගයක් මේ සඳහා ගත යුතු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගරු මාලින්ද මුදන්නායක මන්ත්‍රීතුමා, ලයිට් 1000 ක් ගෙනා බවත්, එම ටිකෙන් මේවන විට 933 ක් සවි කර ඇති බවත්, අවුරුදු 2 ක වොරන්ටියක් තිබෙන බවත්, දැන් ඒවා නැවත ගලවා දැමිය යුතු බවත්, ඊළඟට තව 500 කට අනුමැතිය ලැබී ඇති බවත්, ඒ 500 බ්‍රැන්ඩ් එකකින්ම ගැනීමට කටයුතු කරන බවත්, පිච්චිව බල්බ් වලට වොරන්ටි කාලය තවම තිබෙන නිසා, එම බල්බ් ගලවද්දිම අලුතින් ගෙන්වන බල්බ් එකක් සවි කිරීමට කටයුතු කරන බව ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ප.ව 01.10 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා.

බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ විටී පහන් අවස්ථා දෙකකදී දැමූ බවත්, තව විටී පහන් 18 ක් දැමීමට තිබෙන බවත්, එම 18 ද සම්පූර්ණ කර දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් චික්‍රමසිංහ මැතිතුමා ප.ව 01.13 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා ප.ව 01.07 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා.

මින්නාන කොට්ඨාශයේ පන්ගොඩැල්ල මාර්ගයේ වර්ෂාව සමඟ නිවසක් ආසන්නයේ පැතිබැම්මක් කඩා ගෙන ගිය කාරණයක් සම්බන්ධව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය විසින් යෝජනාවක් ගෙන ආ බවත්, එම මාර්ගය වහන එහා මෙහා ගිය මාර්ගයක් බවත්, නමුත් දැන් මේ වන විට බයිසිකලයක් වගේ පමණක් ගමන් කළ හැකි බවත්, ප්‍රධාන පාරට සම්බන්ධ විය හැකි විකල්ප මාර්ගයක් බවත්, එම යෝජනාව සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සඳහා මේ වන විට සුහදායි පිළිතුරක් තිබෙන බවත්, මේ වන විට ඒ සඳහා ඇස්තමේන්තු සකසා ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා.

ඒ වගේම ලක්ෂ 33 ක් වියදම් කර ජල යෝජනා ක්‍රමයක් මාස එකහමාරකට දෙකකට කලින් විවෘත කළ බවත්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගමේ මිනිසුන් ඉතාම සතුටු වූ බවත්, නමුත් එම ජලය බීමට ගැනීම සම්බන්ධව පොඩි ගැටලුවක් පවතින බවත්, එම ජලය ජබොස් එකකින් ලබා ගන්නා බැවින් ජලය බොර වී පවතින බවත්, එම ජලය පානය කිරීමට හැකි වන ලෙස ලබා ගැනීමට සුදුසු පරිදි සකස් කර දෙන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වී සිටින විපක්ෂය කණ්ඩායමට ද එක ලයිට් එකක් හරි ලබා දෙන්න කියා ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගරු ගයාෂාන් මන්ත්‍රීතුමාලගෙ ගේ ළඟටත් ලයිට් එකක් දැම්මා.නමුත් ඒක පත්තු වෙන්නැ.ඒක එම ස්ථානයේ ලයින් එකේ දෝෂයක්ද කොහෙද යන්නෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කළා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

මේක පැහැදිලි කරන්න ඕනේ.මේ අපේ ගේ ළඟ කියන්නේ අපේ ගේ ළඟ නොවන බවත්, තමාගේ ගේ ළඟ ලයිට් එකක් තියෙනවා එය තමා පෞද්ගලික මුදලින් පවතාවාගෙන යන බවත්, අපේ ගේ ළඟ යනුවෙන් සභාපතිතුමා සඳහන් කළේ තමා යන ගරු සුජීව මන්ත්‍රීතුමා යන, ගරු සුමිත් මන්ත්‍රීතුමා, ගරු අජන්ත මන්ත්‍රීතුමා, ගරු නදුන් මන්ත්‍රීතුමා යන ගරු ආරියදාස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ බුළුගහපිටිය කොට්ඨාශයට හැරෙන තැන තියෙන පළමු විථී පහන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් පැහැදිලි කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප.ව 01.18 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.

තමා ස්තුති කිරීමක් කරන්න මේ අවස්ථාවක් කර ගන්නා බවත්, මෙම සභාවේ කලින් දෙකෝටි ගණනක වරිපනම් හිඟයක් තිබුනු බවත්, ඒම නිලධාරින්ගේ කැපවීම හා උනන්දුව මත වරිපනම් බදු ලක්ෂ 50 කට ආසන්න මුදලක් එම නිලධාරීන් අය කරගෙන ඇති බවත්, විශේසයෙන් ම වරිපනම් අංශයේ සිටින්නේ කාන්තා නිලධාරීන් බවත්, එම පිරිස නොයෙකුත් තාඩන පිඩන මැද්දේ එම මුදල් එකතු කිරීමේ කාර්යේ නියලෙන බවත්, සභාවේ සියලුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් තමන් මේ අවස්ථාවේ විශේෂ ස්තුතියක් කරන බවත්, එම නිලධාරින්ට මරණ තර්ජන පාවා පැමිණි බවත්, එම නිලදාරින්ගේ කැපවීම මත මෙම ලක්ෂ 50 කට ආසන්න පුදලක් ලබා ගැනිමට හැකි වී ඇති බවත්. එය මෙම වර්ෂයට අදාළ ඒවා නොවන බවත් එම මුදල් හිඟ වරි පනම් බදු මුදල් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

ඒ වගේම නගර සිමාව තුළ අලුත් වීථී පහන් සවි කරගෙන යන බවත්, ඒ සඳහාද ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තුතිවන්ත වන බවත්, විලේගොඩ සිමාවටත් බල්බ් හැකි පමනින් දෙකක් හෝ තුනක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන බවත්, නගර සීමාවෙ, වරිපනම් ගෙවන සීමාවේ අක්‍රිය වුණු විදුලි පහන් කිහිපයක් තිබෙන බවත්, නගර සීමාවේ වැඩ අවසන් වූ පසු ඒ සඳහාද ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කළේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

නගර සීමාවේ සිට මෝරගල දක්වා වීථි පහන් සවි කර ඇති බවත්, ඒ සඳහා විශේෂ ස්තුතියක් ගරු සභාපතිතුමාට පුද කරන බවත්, එම ලිටි වලින් එකක් දෙකක් වැඩ කරන් නැති බවත්, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා ප.ව 01.22 ට සභා ගර්භයෙන් පිට විය.
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ප.ව 01.22 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මෝරගල මහජන ක්‍රීඩාංගනයට යන මාර්ගයේ වැඩ කටයුතු නිම වෙමින් පවතින බවත් ඒ සඳහාද ස්තුති කරන බවත්, මෙහි මුල්ගල තැබීමට ප්‍රජා ශක්ති මන්ත්‍රීවරුන් පැමිණුන බවත්, මහජන නියෝජිතයෝ ඒ ගමේ මිනිස්සු කවුරුත් එතල නැති බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒක ගරු මිස්බාහ් මන්ත්‍රිතුමා විසින් ගෙන ආ යෝජනාවක් බවත් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් සඳහන් කරන්නට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා.

සති දෙකකට පෙර පොළ භූමියට වෙන් කළ කසල වගයක් පුද්ගලයෙක් විසින් ගෙන ආ බවත්, එම කසල පොළේ තිබෙන කසල තට්ටුවට දමන්න හදන විට, එම ස්ථානයේ සිටින සකුරිටි මහතා විසින් ප්‍රකාශ කළා ලු කසල දාන් බැරි බවත්, දැන් මෙතනට පැමිණියේ රු.1500.00 ක් දීලනේ, නැවත 3000.00 ක් දීලා බේරුවාන කසල අංගනයට ගෙනියන ලෙස පැවසා ඇති බවත්, ඒ සම්බවන්ධව සභාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙසත්, සිකුරිටි මහතාට මේ බව දන්වන ලෙසත්, එය හරි අසාධාරණයක් බවත්, තමන්ද දුරකතන මාර්ගයෙන් සිකුරිටි මහතාට කතා කළ බවත්, තමා කියන දේවත් සිකුරිටි මහතා නොවැසු බවත්, එම මහතාට එහෙම රාජකාරි කරන්න හොඳ නැති බවත්, නීතිය හරියට කරන ලෙසට පැහැදිලි කර දෙන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෝරගල හන්දියේ මාර්ගය දෙපසම කාණු වැලිවලින් පිරිඇති බවත්, කම්කරුවන් දෙසෙනෙකු යොදවා එය සුද්ද කරනවා නම් එය ලොකු උදව්වක් බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා ප.ව 01.24 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

හුනුගෙවත්ත අස්ගගුල පාර තාප්පයක් පුපුරා යැම සම්බන්ධව ප්‍රාදේශිය සභාව දැනුවත් කිරිම 2026.06.06 දින සිදු කර ඇති බවත්, එම ස්ථානයේ ඡායා රූපයක් තමන්ගේ වට්ස්ඇප් එකටත් ඔවුන් විසින් යොමු කර ඇති බවත්, ඒ බැම්ම අවධානම් බැම්මක් බවත්, තමා එම ස්ථානයට ගොස් බැලු බවත්, මගියෙක් ගමන් ගන්නා වෙලාවක මේ තාප්පය වැටුනොත් මරණයක් පවා සිදු විය හැකි සස්ථානයක් බවත්, එම ස්තානය කඩිනමින් නිරීක්ෂණය කර ඒ සම්බන්ධව ඉක්මනින් කටයුතු කිරීමට හැකිනම් එය ඉතා මත් හොඳ බවත්, එම ඡායා රූපය මන්ත්‍රී මණ්ඩලයේ වට්ස්ඇප් සමුහය වෙත තමන් විසින් යොමු කිරීමට කටයුතු කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 01.26 ට සභා ගර්භයෙන් පිට විය.

ගැටහැත්ත සමෘද්ධි ප්‍රජා මුල බැංකුවේ වහල මතට ගස් වගයක් බර වී පවතින නිසා වහලයට හානිවී තිබෙන බවත්, මේ තත්ත්වය ඉක්මනින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට ලිපියක් මඟින් දැනුම් දීමක් සිදු කර ඇති බවත්, ඒ සම්බන්ධව ක්‍රියාත්මක වන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

විලේගොඩ විද්‍යාලය පිටුපස ලාල් මහතාගේ නිවසට යන මාර්ගය දෙපස පැති බැම්ම බැඳලා, ඒ කට කියන නම තමා නොදන්නා බවත්. දැල් පාලම කියන එක වෙන්න ඇති කියා තමා සිතන බවත්, එම ස්ථානයේ නිවාස 20 ක් පමණ තිබෙන බවත්, එය දිරා ගොස් ඇති බවත්, තමන් ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සවයකට සම්බන්ධ වූ අවස්ථාවක, මෙය සභාව දැනුවත් කර මෙම කටයුත්ත සිදු කර දෙන ලෙසට ප්‍රදේශවාසීන් විසින් ප්‍රකාශ කළ බවත්, එම ස්ථානයෙන් වාහනයක් ගමන් කිරීමේ දී එයින් වාහනයක් ඇතුළට කඩාගෙන යයි වගේ තත්ත්වයක් තිබෙන බවත්, ධනරත්න මන්ත්‍රීතුමා තමා ඒ පාලම සකසා දුන්නේ, දැන් ඒක දිරලා තියෙන්නේ. ඒක නිසා තමා ඔබතුමිව දැනුවත් කරන්නේ කියලා ඔවුන් විසින් ඒ අවස්ථාවේදී තමා හට ප්‍රකාශ කරන ලදී. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා දැනුවත් කළා යැයි ඔවුන් ප්‍රකාශ කළ බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියා ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

විදුලි පහන් සඳහා අවුරුදු දෙකක වගකීමක් සහතිකයක් පවතින ලෙස ප්‍රකාශ කළත් මේ වන විට ගම් මට්ටමින් සවි කළ විදී පහන් බොහොමයක් පිච්චී ඇති බවත්, එම පිච්චි ගිය බල්බ් කල් වේලා ඇතුව ගලවා ගත හොත් ඒවා නැවත මාරු කිරීමක් කර ගත හැකි බවත්, පනාවල පාරේ බල්බ් සවි කර නොමැති බව මීට පෙර සභා වාරයකත් ප්‍රකාශ කළ බවත්, එය මේවන විට සවි කොට ඇති බවත්, ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ස්කයිවේ ගැරේජ් එකට එහා විජේනායක මාවතට යන තැන පෙරපාසල අසල අනුමත දැන්වීම් පමණයි කියා දැන්වීම් පුවරුවක් සවි කොට ඇති බවත්, අනුමත දැන්වීම් කියන්නේ මොකක්ද කියා තමා මේ අවස්ථාවේ අසා සිටින බවත්, නමුත් එම දැන්වීම් පුවරුවේ මරණ දැන්වීම් පවා අලවා ඇති බවත්, එම දැන්වීම් පුවරුව සභාවෙන් සවි කළ දැන්වීම් පුවරුවක් බවත්, එවැනි දැන්වීම් පුවරු ප්‍රසිද්ධ ස්ථානවල සවි කිරීමට වසමකට එකක් හරි ලබාදීමට හැකි නම් ඒකත් සුදුසුයි කියා තමා යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

දංකුඹුර ප්‍රදේශයේ සිදුවූ සිද්ධිය සම්බන්ධ ලිපිය ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාට ඉදිරි කටයුතු කිරීම සඳහා ලබා දෙන බවත්, මෙය ප්‍රදේශවාසීන්ගෙන් පැමිණි චොදනාවක් බවත්, ඒනිසා තමා ඒ සම්බන්ධව සභාවේ කතා කළ බවත්,තමන්ට හැකි අයුරින් සාකච්ඡා කර මෙම ලිපිය සැකසු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය විසින් සඳහන් කළ දැන්වීම් පුවරුව සඳහා සභා මුදල් වියදම් නොවූ බවත්, පීපල්ලීසිං ආයතනය විසින් ලබා දුන් පරිත්‍යාගයක් බවත්, එවැනි දැන්වීම් පුවරු 12 ක් ලබා දුන් බවත්, ඉතිරි වසම් සඳහාද ලබා ගැනීමට හැකි නම් ලබා ගැනීමට කටයුතු කරන බවත්, මේ සඳහා සභා මුදල් වැය නොවූ බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

විටී පහන් වලින් ආලෝකමත් කිරීම සම්බන්ධව විලේගොඩ ප්‍රදේශවාසින්ගේ ස්තුතිය මේ මොහොතේ දී ප්‍රකාශ කරන අතර තුර තව කිහිප ස්ථානයක විදුලි පහන් වලින් ආලෝකමත් විය යුතුයි කියා කියන බවත්, ඒ සඳහාද අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය ප.ව 01.31 ට නැවත පැමිණෙන ලදී.

තමන් විසින් ගිය සභාවේදී යෝජනා කළ යෝජනා දෙක අදාළ ආයතනවලට යොමු කළ බව සඳහන් කරමින් ලේකම්තුමා ලිඛිතව දැනුම් දී ඇති බවත්, එහෙත් තමා හදිසි යෝජනාවක් ලෙස ඇහැලියගොඩ ජාතික පාසලේ ඉඩම සම්බන්ධව තමන් ලිපියක් ඉදිරිපත් කළ බවත්, ඒ සම්බන්ධව කිසිම පිළිතුරක් මේ වන තෙක් ලැබී නොමැති බවත්, තමන් ජාතික පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ නිලධාරියෙක් විදිහට කටයුතු කරන බවත්, එම ලිවුම සම්බන්ධව එම සංගමය දැනුවත් කිරීමට කිසිදු තොරතුරක් නොලැබුණු බවත්, ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා ප.ව 01.32 ට නැවත පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 01.32 ට සභා ගර්භයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ගියවර මුදල් කාරක සභාවේ මේ සම්බන්ධව කතා කළ බවත්, මන්ත්‍රීතුමා ගියවර කාරක සභාවට සහභාගි වුයේ නැද්ද යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ගරු අතුරලිය මැතිතුමාගෙන් ප්‍රශ්න කරන ලදී.ඇහැලියගොඩ ජාතික පාසලට විධිමත්ව ලිපියක් මඟින් ඒ සම්බන්ධව දැනුවත් කර ඇති බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

ඒ සාකච්ඡා කළ කරුණු සම්බන්ධව ලිඛිතව ලබා දීමට කටයුතු කරනවා නම් හොඳ බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

නැවත එම කාරණය සම්බන්ධව විධිමත් යෝජනාවක් ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාට ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

රාජකරුණා මහතාගේ නමත්, සංස්කෘතික බල මණ්ඩලයේ සභාපති ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාත් වශයෙන් පුස්තකාල පාඨක සමාජයට නම් දෙකක් යෝජනා කළ බවත්, එම නම් දෙක පුස්තකාල කාරක සභාව සඳහා ඇතුළත් කළා ද යන්න ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විමසන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

ඒ සම්බන්ධව සලකා බලන්නම් යනුවෙන් ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා.

පොළ භූමියේ යම් සිද්ධි මාලාවක් වූ බවත්, පොළ භූමියේ වැසිකිළිය නඩත්තු කිරීම සම්බන්ධව වෙළෙන්දන් ඇතුළු එය භාවිතයට ගන්නා සියලු දෙනාගේ එහි පිරිසිදුභාවය සම්බන්ධව විරෝධයක් පවතින බවත්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසට ඉල්ලීමක් කරන බවත්, පොළ භූමියේ පවතින ගලිවලවල් කිපය සම්බන්ධව සෑම සභාවාරයකම තමා කතා කළ බවත්, ඒ සම්බන්ධව කටයුතු කර නොමැති බවත්, මේ ආසන්න දිනක එක් පුද්ගලයෙක් වැටී තුවාල වූ බවත්, ඒ සම්බන්ධව ද විශේෂ අවධානය යොමු කරන ලෙස තමන් ඉල්ලීමක් කරන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විලේගොඩ සුසාන භූමියේ නඩත්තු කටයුත්තක් සිදු වූ බවත්, ඒ සම්බන්ධව ප්‍රණාමය පුද කර සිටින බවත්, එහිද ගලි වලවල් කිහිපයක් තිබෙන බවත්, ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන ලෙසටද ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ජානිස් මාවත පුළුල් කර විධිමත්ව සැකසීමේ කටයුත්ත සිදු කරන ලෙසත්, දම්මුල්ල මාර්ගය දැඩිලෙස අබලන් වී ඇති බවත්, බස්රථ කිහිපයක් නඩත්තු කටයුතු සඳහා යොමු කර ඇති බවත්, බයිසිකලේකවත් යාමට අපහසු ස්ථාන රාශියක් තිබෙන බවත්, දැන් සිට දම්මුල්ල මාර්ගය නඩත්තු කටයුතු සඳහා යොමු නොකළ හොත් තව මාස කිහිපයක් ඇතුළත ලොකු ගැටලුවකට මුහුණ දීමට සිදු වන බවත්, දම්මුල්ල මාර්ගය භාවිත කරන වෙළෙඳ ව්‍යාපාරික ප්‍රජාවට හා ප්‍රදේශවාසීන්ට එය විභාල ප්‍රශ්යක් බවට පත් වන බවත්, ඒ සඳහා විධිමත් මැදිහත් වීමක් වන ලෙසට යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ රාජ්‍ය සේවකයෙකුට ලක්ෂ 12 ක ලිසිං පදනම මත වාහනයක් ලබා දෙන බව සඳහන්ව තිබෙන බවත්, එහි ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස හාල් කිලෝ 20 ක් ලබා දීමට තීන්දු කර තිබෙන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව, නිවාස හා පොදු පහසුකම් කාරක සභාව, පරිසර හා පොදු පහසුකම් කාරක සභාව හා කාර්මික සේවා කාරක සබාව වශයෙන් කාරක සභා 4 ක් තිබෙන බවත්, එම කාරක සභා 4 ට මේ මන්ත්‍රීවරුන් ඕනම කෙනෙකුට සම්බන්ධ විය හැකිද? නොයෙසේනම් එම කාරක සභාවලට සම්බන්ධ අයටත් ඒ සඳහා සම්බන්ධ වෙන්න පුළුවන් ද යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා ප.ව 01.40 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 01.40 ට සභාවෙන් ගර්හයෙන් පිට විය.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
නම් කර තිබෙන අයට විතරයි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

විශේෂ අවස්ථාවල ඉල්ලීමක් කර ඒ සඳහා සම්බන්ධවීමට හැකිද? ඒ සඳහා පැමිණ අදහස් දැක්වීමට හැකිද? කමිටුවේ සාමාජිකයෙක් ලෙස අත්සන් කිරීමට හැකි ද යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

අවශ්‍ය නම් සම්බන්ධ වීමට හැකි බවත්, අත්සන් කිරීමට හැකි වන්නේ කාරක සභා සාමාජිකයින්ට පමණක් බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා.

පරිසර කාරක සභාවේ උපසභාපතිතුමා සාමාජිකයෙක් නොවන බවත්, එහෙත් පරිසරහා පොදු පහසුකම් කාරක සභා වාර්තාවේ උපසභාපතිතුමා අත්සන් කර ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ මන්ත්‍රිවරයෙක් විදිහට පත් වූ විට කිසිම නීතියක් කඩන්න කිසිම බලයක් නොලැබෙන බවත්, ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන බවත්, ප්‍රදේශයේ පළමු පුරවැසියා සභාපතිතුමා බවත්, ඉන් පසු සභාවද, සමාජයේ නීත්‍යානුකූලව කටයුතු කළහොත් පමණක් සමාජයේ පෙනි සිටීමට හැකි බවත්, තමා ඇතුළු මන්ත්‍රිවරු 36 දෙනාටම, තමන් වරදක් කරමින් වෙන කෙනෙකුගේ වරදක් පෙන්වා දීමට නොහැකි බවත්, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමට මේ සභාවේ අයදුම් පත්‍රයක් තිබෙන බවත්, ගෙයක් හැදුවත්, තාප්පයක් හැදුවත් එය අනුමත කරගෙන සිදු කළ යුතු බවත්, නමුත් එය ප්‍රායෝගිකව සිදු නොවන බවත්, තමන් ඇතුළු මන්ත්‍රිවරු 36 දෙනාම ඒ සම්බන්ධව දැනුවත් කරන ලෙසත්, එවිට මේ පවතින ගැටුම් අඩු වන බවත්, නැත්නම් සමාජය තුළ පිරිහීමට ලක් වන බවත්,එක් මන්ත්‍රිවරයෙක් කරන වැරැද්දක් සියලුම මන්ත්‍රිවරුන්ට බලපාන බවත්, 36 දෙනාම හදුන්වන්නේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රිවරු ලෙසින් බවත්, 36 දෙනාම කරන වැරදි 36 දෙනාම බලපාන බවත්, හැදුනුම්පතේ තමාගේ දේශපාලන පක්ෂය සටහන් කර සිටියට වැඩක් නැති බවත්, ඒ සම්බන්ධව දැනුවත් කිරීමක් කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභා වාර්තාව පැහැදිලි මදි බවත්, ලියන විදිහ කියන විදිහ වෙන්නත් පුළුවන් බවත්, සමහර කොටස් මඟහැරී ඇති බවත්, නිලධාරීන් ඒ සඳහා පොඩ්ඩක් මහන්සිවී සකස් කිරීමට කටයුතු කරන ලෙසත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මහේෂ් මහතාගේ නිවස අසල මාර්ගය සකස් කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා සමඟත් සාකච්ඡා කල බවත්, ඉන්ටලොක් ගල් අල්ලා සකස් කල කොටසේ තව ඉතිරි කොටසක් ද තිබෙන බවත්, ඉතුරු වූ ගල් ටිකක් ද තිබෙන බවත්, එම කොටසත් සකස් කර දීමට සභාපතිතුමා පොරොන්දු වූ බවත්, ඒ සම්බන්ධව සන්තෝෂ වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 01.46 ට නැවත සභාවට පැමිණෙන ලදී.

ප්‍රධාන මාර්ගයේ විදුලි පහන් සවි කරන බවත්, ඒ සම්බන්ධව මිනිසුන් සතුටින් කතා කරන බවත්, යායපාර මාර්ගයෙත් විදුලි පහන් කිහිපයක් තව සවි කිරීමට තිබෙන බවත්, ඒ ටිකද ඉදිරියට සවි කිරීමට කටයුතු කරන බවද ? බුළුගහපිටිය මාර්ගයෙත් මාර්ගය ආරම්භ වන ස්ථානයේ එක බල්බ් එකක් සවි කළ බවත්, ඉතිරි බල්බ් සවිකිරීමට නියමිත තැන්වල සවි කිරීමට යෝජනා කරන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ජානිස් මාවත අඩි 20 කට පුළුල් කිරීමට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා ඉල්ලීම් කරන යෝජනාව නගර සැලැස්මේ ඇතුළත් කර ඇති බවත්, එය පළමුව සිදු කිරීමට යෝජනා කර ඇති බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

දන්දෙනිය මාර්ගයේ ප්‍රශ්නයක් තිබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්. එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගේ නිවසට ආසන්නයේ කාණුව ගොඩවී මාර්ගයේ ගමන් කිරීමට අපහසු ආකාරයෙන් දුර්ගන්දයක් හමන බවත්, එම ස්ථානයේ තිබූ බෝක්කුව ප්‍රදාන මාර්ගය කාපට් කර සකස් කරන විට වසා ඇති බවත්, තමන් ඩෙංගු වැඩසටහනකට

සහභාගි වූ අවස්ථාවේ ප්‍රදේශවාසීන් ඒ බව ප්‍රකාශ කළ බවත්, තමන්ද එම ස්ථානයට ගිය බවත්, සියලුම නිවෙස්වල අපද්‍රව්‍ය බැහැර කරන නළ මාර්ග ද එම කාණුවට යොමු කර ඇති බවත්, වැසි කාලයේදී පානීය ජලය ලබා ගන්නා ළිං වලටද බලපාන බවත්, PHI මහතා ද එම ස්ථානය පරීක්ෂා කළ බවත්, ඒ සම්බන්ධව RD එක දැනුවත් කරන ලෙසත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඩෙංගු මාරාන්තික බවත්, ඒ පිළිබඳව මේවන විට විශාල කතිකාවතක් ගොඩනැගී තිබෙන බවත්, මරණ ද 49 ක් පමණ වාර්තා වී ඇති බවත්, 2014 ඇහැලියගොඩ මරණ 4 ක් සිදු වී රෝගීන් 600 ක් සිටි බවත්, අන්න එක නැති කරපු ආකාරය පිළිබඳව කතා කිරීමට අවශ්‍ය බවත්, තමන්ද ඒ සඳහා දායකත්වය සැපයූ පුද්ගලයෙක් බවත්, ඒ මියගිය 4 දෙනා අතර ධර්මපාල විද්‍යාලයේ ශිෂයාවක්ද වූ බවත්, නමුත් 2015 වන විට ඇහැලියගොඩ ඩෙංගු එක් රෝගියෙක්වත් නැතිවන ආකාරයේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්,එම වැඩසටහන අති සාර්ථක වැඩසටහනක් බවත්, වෛද්‍ය අධිකාරී ඩොක්ටර් අබේවික්‍රම මහතා එහි මුලිකත්වය ගත්, අතර තමන් එහි ලේකම් හැටියට කටයුතු කළ බවත්, එම වැඩසටහන පුර්ණකාලීනව සිදු කළ බවත්, ඒ තුළින් ඇහැලියගොඩ ඩෙංගු රෝගය තුරන් කිරීමට හැකි වූ බවද, එදා ප්‍රාදේශිය සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, රෝහල, මහජන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය ඒ සඳහා සම්පුර්ණ අනුග්‍රහය දැක්වූ බවත්, දේශපාලන අධිකාරිය උදව් කළ බවත්,මර්වින් සිල්වා ඇමතිතුමා ඒසම්බන්ධව සොයා බැලීමට පැමිණුනු බවත්, ඉන්පසු මන්ත්‍රීවරු විශාල පිරිසක් පැමිණ එය බැලූ බවත්, එය ජාත්‍යන්තර මට්ටමට පවා ගිය බවත්, අද්ත් මේවන කොට අප්‍රිකන් රටවල, ඉන්දියාව, මාලදිවයින වැනි රටවල ඒ වැඩසටහන් ක්‍රියාත්මක වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. එම වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟ 2016 වන විට එක මදුරුවෙක්වත් නොසිටි බවත්, ඩෙංගු විතරක් නොව අනෙක් මදුරුවොත් විනාශ වූ බවත්, නමුත් ඒ වැඩසටහන නැවතුණු බවත්, එම වැඩසටහන අතිසාර්ථක වැඩසටහනක් බවත්, සභාපතිතුමා මේ සම්බන්ධව මැදිහත් වන ලෙසත්, ඩොක්ටර් අබේවික්‍රම මහතා ගෙන්වා හෝ සාකච්ඡා කර ඒ වැඩසටහන නැවත පණ දීමක් සිදු කළ හැකි බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

මේ සභාව ඉදිරියට රැගෙන යාමට අවශ්‍ය නිසා මේවෙලාවේ අදහස් දැක්වුයේ යම් අර්ථයක් ඇතිව බවත්, ඒ නිසා මන්ත්‍රීවරු යම්කාරණා තර්කානුකූලව ඉදිරිපත් කළ විට, ඒය අවබෝධ කර ගැනීමේ බුද්ධියේ ඥානය කොයිතරම් ද කියන එක, ඒ අනුව තමා යම් කාරණා අවබෝධ කර ගන්නේ.ඒ නිසා අවබෝධ කරගෙන වැඩකටයුතු කරන්න කියලා කියනවා.ගරු සභාපතිතුමා මේක ගෙනියන්න වෙර දරනවා.මේක කළ යුතු කාරණාව නිසා.මේ පැත්තේ ඉදගෙන අපි මේකට අකුල් හෙළනවා නෙමේ අපිටත් ඕනේ මේකෙ යම් කිසි දෙයක් කරලා යන්න.ඒ නිසා මේ අවස්ථාවේ දී අපි ඒක තමා සභාවේ දී මේ කියන්නේ.ඒක තේරුම් ගැනීමේ හැකියාව තියෙන්නේ කාට ද,ඒ අය ඒ ගමන යයි සභාපතිතුමා.අපි නිළදාරීන්ටත් කියා සිටිනවා.අපේ කාර්ය භාර්යත් මේ විදිහට ඉදිරියටත් කරනවා.මොකද අපිට ශත පහක්වත් දෙන්නේ.උපසභාපතිතුමා දෙන්නෙත් නැනේ.ඒ නිසා ඔබතුමාලා මේක ක්‍රමවත්ව අරගෙන යන්න කියා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා ඩෙංගු ප්‍රශ්නය සම්බන්ධව කතා කළ බවත්,මේ වන විට ඩෙංගු මරණ සීමාව 50 සීමාව අසන්නයට පැමිණ ඇති බවත්, තමා සභාවට පැමිණුන වෙලේ සිට කතා කළේ සභාවේ වගවීමයි වගකීමයි ගැන බවත්, සමාවෙන්න, මං විශ්වාස කරනවා ලේකම් තුමා තරහ වෙන් නැති වෙයි කියාලා.අපේ කෝණෙන් දකින වැරදි අඩු පාඩු පෙන්වා දිම විපක්ෂයේ යුතුකමක් බවත්, තැන් තැන්වල ගොස් ෆේස්බුක් මාධය හරහා නොදමන බවත්, තමන් වගකීමයි වගකීමයි පිළිබඳ අද දින වැඩිපුර කතා කළ බවත්, සමහරවිට එය වැරදි වෙන්නත් පුලුවන් බවත්,අද වන විට ඩෙංගු මරණ වැඩි වී ඇති බවත්, තමන් දන්න විදිහට අයි.ඩී.එච්., රාගම ,කොළඹ ප්‍රධාන පෙළේ රෝහල් සියල්ලගේ ම ලෙඩ්ඩුන්ට ඉන්න ඉඩ නැති ප්‍රශ්නයක් පවතින බවත්, අද වනවිට ඇහැලියගොඩ තත්ත්වය තමන් නොදන්නා බවත්, ඒ සම්බන්ධ සංඛ්‍යා දත්ත ගරු සභාපතිතුමාගෙන් දැන ගැනීමට කැමති බවත්, මේ ඩෙංගු ප්‍රශ්නය පිළිබඳව මීට වඩා ආණුඩුව වගකිවයුතු බවත්, මීගමුවෙ ප්‍රශ්නයක් වූ බවත්, මේ සඳහා ආණ්ඩුව වගකියන්න ඕන බවත්, කොරෝනා කාලේ ආණ්ඩුව වගකීම භාරගත් නිසා කොරෝනා ප්‍රශ්නය යම්තාක් දුරට විසඳ ගැනීමට හැකි වූ බවත්, එම නිසා මේ ප්‍රශ්නයේ වගකිම මීට වඩා කරට ගත යුතු බවත්. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා මේකට දේශපාලනය සම්බන්ධ නෑ කියා ප්‍රකාශ කළත්, මෙය සම්පුර්ණයෙන් ම සම්බන්ධ දේශපාලනයට බවත්, දේශපාලන

තින්දු තීරණ ප්‍රතිපත්ති හරහා මොං මර්දනය කළ හැකි බවත්, ඒ නිසා සභාපතිතුමා මේ ප්‍රදේශයට නායකත්වය ලබා දෙන ඔබතුමා මේ ඇහැලියගොඩ ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව අඩු කර ගැනීමට, සම්පූර්ණ 100% ක වගකිම ගරු සභාපතිතුමාට තිබෙන බවත්, මේ ප්‍රදේශයේ යම් ප්‍රශ්නයක් වුවහොත් එහි වගකිම ගරු සභාපතිතුමා ගත යුතු බවත්,ඒ නිසා දේශපාලඥයින් විදිහට විශාල වගකීමක් තිබෙන බවත්, විපක්ෂයටත් නායකත්වය දෙමින් මේ උවදුර පාලනය කර ගැනීමට කටයුතු කළ යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෝරගල ප්‍රදේශයේ යම්කිසි ප්‍රදේශයක් නගර සංවර්ධනය වෙනුවෙන් වෙන් කර තිබූ බවත්, මේ දවස් ටිකේ මෝරගල සිට නගරයට පැමිණෙන විට මාර්ගයේ දකුණු පස කළු පැහැති ආවර්ණ යොදා තිබෙන බවත්, එම ආවරණ ඇතුළේ කුමක් සිදුවනවා ද යන්න තමන් නොදන්නා බවත්, මේ ස්ථානයේ ඉදි කිරීම් පිළිබඳව සභාව දැනුවත් ද කියන කාරණාව තමාට ප්‍රශ්නයක් පවතින බවත්, මිනිස්සුන්ට කලින් ආණ්ඩුවලින් පොරොන්දු වී තිබ්බේ මේ ප්‍රදේශය ලස්සන පුරවරයක් කරන්න බවත්, ඒ ලස්සන පුරවරයක් කිරීමේ සැලැස්මේ රේල්පාරයි මහා මාර්ගයයි අතර කොටස භූ දර්ශන කාලාපයක් වශයෙන් වෙන් කර තිබූ බවත්, නගර සංවර්ධනයේ දී ඒ සම්බන්ධව අවධානයෙන් සිටි බවත්, එම භූ දර්ශන කලාපය අද වන විට අහිමි වෙමින් පවතින බවත්, එහි වගකීමත් ගරු සභාපතිතුමා විසින් ගත යුතු බවත්, ඊළඟට තම ආණ්ඩුවට බලයක් ලැබුණොත් ඒවා කඩා දමන විට අපහසුතාවට පත් වන බවත්, ඒ නිසා ගරු සභාපතිතුමා ඒ සම්බන්ධව විශේෂ සැලකිල්ලක් දක්වන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.අද වන විට විවිධ ගොඩනැගිලි ඉදි කර ඇති බවත්, නගර සංවර්ධන කටයුතු සඳහා එය ආරක්ෂා කර දෙන ලෙසට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා.

ඔබතුමා ඔබතුමාගේ සම්බන්ධකම් පාවිච්චි කර විදුලි පහන් සවි කරන බකට් එක ලබා ගෙන දවස් ගණාවක් තිස්සේ වැඩ කටයුතු සිදු කරගෙන යන බවත්. ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඇතුළු තමාද පළමුව ස්තුතිවන්ත වන බවත්, ඔබතුමාට බකට් එක ලබා ගන්න බැරි ඇයි කියා ගියවර සභාවාරයක ප්‍රශ්න කළ බවත්, ඒ සඳහා ප්‍රණාමය පුද කරන බවත් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 01.55 ට සභා ගර්භයෙන් පිට විය.

පොළ සම්බන්ධ කාරණාවේදී ඉදිරියේ දී ගිවිසුම් ගත වීමේ දී එහි වගකීම සභාව ගත යුතු බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා ප්‍රකාශ කළ පරිදි වගකීම වගවීම පිළිබඳව සභාවේ ප්‍රධානියා හැටියට ගරු සභාපතිතුමාට තිබෙන බවත්, ඒ වගේම මේ මන්ත්‍රී මණ්ඩලයට ම ඒ වගකීම තිබෙන බවත්, උපක්‍රමශීලී විධි භාවතා කරලා ලයිට් බිල් වෙන ඒවා පොළ බදුකරුවන්ට දුන්න එක හරි බවත්, නමුත් එක්ලක්ෂ ගාණක් ජීවත් වන මේ වසම් 44 තුළ ජනතාව මේ සභාව පිළිබඳව අවධානයෙන් සිටින බවත්, එහි කුමක් හෝ අඩුපාඩුවක් සිදු වූ විට එහි චෝදනාව සභාපතිතුමාට එල්ල වන බවත්, ආණ්ඩු පක්ෂයට එල්ල වෙනවා,උපසභාපතිතුමාට එල්ල වෙනවා.ඉන් පසු විපක්ෂ මන්ත්‍රීවරුන්ට හා ලේකම්තුමාට ද එල්ල වන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ලේකම්තුමා මෙම බලප්‍රදේශයේ නොන බවත්, නමුත් මිනිසුන් බනිනකොට බනින්නේ පොදුවේ බවත්, ඒ සම්බන්ධවත් අවදානය යොමු කරන ලෙසත්, ලේකම්තුමා යම් උත්සහයක් ගත්තේ සභාවත් ආරක්ෂා කර ගෙන පොළ බදුකරු මඟින් ඒ රාජකාරියත් කරගෙන අපට හානියක් නොවන පරිදි කටයුතු කිරීමට බවත්, එය තමන් පිලිගන්නා බවත්, නමුත් ඒ සද්භාවයයි, ප්‍රදේශයේ ජනතාවගේ අවබෝධයයි දෙකක් බවත්, ඒ නිසා ඒ සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය හා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා ප.ව 01.56 ට සභා ගර්භයෙන් පිට විය.

ඩෙංගු මර්දනය සම්බන්ධව වැඩසටහනක් සඳහා වෛද්‍යතුමා හා නිලධාරීන් පැමිණ සිටින බවත්, ඒ සම්බන්ධව තමන් කතා කිරීමට උත්සහ නොකරන බවත්, ඒ නිලධාරීන් විශාල කැප කිරීමක් සිදු කරන බවත්, අද දින ගරු සභාපතිතුමා එම නිලධාරීන් පිරිස සම්බන්ධ කර ගෙන මන්ත්‍රීවරු දැනුවත් කිරීම සඳහා ගන්නා වූ උත්සහයටත් ගෞරවනීය ප්‍රණාමය පුද කරන බවත්, ඒ සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නගර සැලැස්මේ අක්කර 47 හෝ 48 හි යම්යම් කටයුතු සිදුවන බවත්,පස් පුරවන කාරණාවලදී ආණ්ඩු පක්ෂයට චෝදනා එල්ලවන අතර ආණ්ඩු පක්ෂයේ බලය නිසා මේ දේවල් සිදු වන බවත්,එම බලය සම්බන්ධව තමන්ද දන්නා බවත්, එම බලය ඉතිහාසයේ භාවිතා කර ඇති බවත්, වරදක් වුණා නම් ඒ වැරදිද භාර ගන්නා බවත්, නමුත් දැනුත් ඒ වැරදිද සිදු වනවා නම්., මාලිමා ආණ්ඩුව යටතේ ඒ වැරදිද අවම වෙතැයි ජනතාව විශ්වාස කළ බවත්, ඒ වැරදි අවම කර ගැනීමේ වගකීම ගරු සභාපතිතුමාට තිබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා ප.ව 01.58 ට නැවත සභාවට පැමිණෙන ලදී.

මන්ත්‍රීවරුන් හා ලේකම්තුමා සමඟ ප්‍රතිපාදන සම්බන්ධව සාකච්ඡා කළ බවත්, නවක මන්ත්‍රීවරුන්ට ගමේ කිසිම වැඩක් සිදු කිරීමට හැකියාවක් නොමැති වූ බවත්, ගරු දිලින් මන්ත්‍රීතුමා, රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමයි තමනනුයි පමණක් පරණ මන්ත්‍රීවරු බවත්, අනෙකුත් සියලුම දෙනා නව ක මන්ත්‍රීවරු බවත්, අඩුම තරමේ සභාපතිතුමා මේ ලක්ෂය දුන්නා, අඩුම තරමේ මේ ලක්ෂ එක හමාර දුන්නා, මගේ මොනව හරි යෝජනාවක් කරනවා කියලා හැඟීමක් එවිට ඇති වන බවත්, ඒක අවංකව තේරුම් ගන්නා ලෙසත්, ඒක උපසභාපතිතුමාට දැනෙයි, උපසභාපතිතුමාට තමන්ගේ ආණ්ඩු කාලයේ යම් ප්‍රමාණයක් ප්‍රතිපාදන වෙන් කර දුන් බවත්, එහෙම නොදුන්න නම් සමාවෙන ලෙසත්, ඇහැලියගොඩ ජනතාව මාලිමා ආණ්ඩුවට බලය ලබා දුන්නේ පෙර ආණ්ඩුවල පැවති ආඩු පාඩු සියල්ලක් ම අවම කරගෙන මේ වසම් 44 ජනතාවට යහපතක් සිදු කරගැනීමට බවත්, පෙර ආණ්ඩුවලින් පැවති ආඩුපාඩු තමන් පිළිගන්නා බවත්, සභාපතිතුමා මේ ගැන අවසානය යොමු කර තමන් දිලීන් මන්ත්‍රීතුමා රංජිත් මන්ත්‍රීතුමා හැර නවක මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට කුමන හෝ මුදලක් වෙන් කරන ලෙසට තමන් වගකීමෙන් ප්‍රකාශ කරන බවත්, ඒ නිසා මේ අවුරුද්ද අවසන් වීමට පෙර යම් මුදලක් ලබා දෙයි කියා තමන් විශ්වස කරන බවත්, ගමේ සමිතියට පුටු 10 ක් වගේ අරන් දෙන්න ඒ වඅභිමානය ඇතිකර දෙන ලෙසටත් ඉල්ලීමක් කළ අතර , සභාපතිතුමාට තව අවුරුදු 10 ක් හෝ ගොස් එහි ප්‍රතිඵලය ලැබෙන බවත්, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.

අද දින සභා රැස්වීම සඳහා පැමිණි ගරු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් සියලු දෙනාටමත්, මාධ්‍යවේදී සියලු දෙනාටත්, සභා ලේකම්තුමා ඇතුළු නිලධාරීන් දෙපළටත් ස්තුතිවන්ත වන බවත්,2026.07.14 වන සාමාන්‍ය සභා රැස්වීමේ කටයුතු මේ සමඟ අවසන් කරන බවත්, ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2026.07.14 වන දින සාමාන්‍ය සභා රැස්වීම 2.00 ට නිමාවට පත් විය.

බන්ධුලසේන දුණුවිල,
සභසභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ.....මස.....දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.